# STRATEGIC CORPORATE PLAN

## උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම

## 2020-2024



## පළාත් පාලන දෙපාර්තමේන්තුව

*දකුණු පළාත*




# EXECUTIVE SUMMARY

## විධායක සාරාංශය

දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව පහසුකම් සපයන පළාත් පාලන ආයතන සංඛ්‍යාව 49 කි. එය ගාල්ල, මාතර සහ හම්බන්තොට මහා නගර සභා 3 කින්ද අම්බලන්ගොඩ, හික්කඩුව, වැලිගම සහ තංගල්ල නගර සභා 4 කින්ද ප්‍රාදේශීය සභා 42 කින් ද සමන්විත වේ. පළාතේ මහජනතාවට පළාත් පාලන ආයතන මගින් සපයනු ලබන උපයෝගීතා සේවාවන්හි තත්වය ඉහළ නැංවීමටත් රටේ ආර්ථික සංවර්ධනයට දකුණු පළාත මගින් දක්වන දායකත්වය ඉහළ නැංවීමට හැකිවන පරිදි යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික පහසුකම් සැපයීමටත් දිස්ත්‍රික්ක 3 හි පිහිටා ඇති පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල 3 හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය කැපවී සිටී.

වර්තමාන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන ” රට හදන සෞභාග්‍යයේ දැක්ම “ හි අන්තර්ගත කරුණු වලට අනුකූල වන සේ හා මධ්‍යම රජය, මුදල් කොමිෂන් සභාව හා පළාත් සභාව මගින් වරින් වර නිකුත් කර ඇති ගැසට් නිවේදන, චක්‍රලේඛ හා මාර්ගෝපදේශයන්ට ගැලපෙන පරිදි හා තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා පිටුවහලක් වන සේ මෙම උපාය මාර්ගික පස් අවුරුදු සැලැස්ම සකස් කර ඇත.

මෙම සැලැස්ම සකස් කර ගැනීමේ දී බාහිර ඇල්ම පාර්ශව කරුවන් (Stake Holders) මෙන්ම අභ්‍යන්තර පාර්ශව කරුවන්ගේ අදහස් යෝජනා, උපදෙස් හා සහයෝගය ලබා ගන්නා ලදි. එසේම ආර්ථික, සමාජ හා සංවර්ධනය පිළිබඳ පළාත් හා සමස්ථ දිවයිනට අදාල දත්ත හා සංඛ්‍යා ලේඛණ උපයේගී කර ගන්නා ලදි.

මෙම උපාය මාර්ගික සැලැස්ම ප්‍රධාන අභිමතාර්ථ 5ක් යටතේ සකස් කර ඇත. පළාත් පාලන බල ප්‍රදේශයන්හි යටිතල පහසුකම් සංවර්ධනය, සනීපාරක්ෂක පහසුකම් හා යටිතල පහසුකම් සංවර්ධනය, පළාත් පාලන ආයනයන්හි ස්වයං ආදායම් උත්පාදනය ඉහළ නැංවීම හරහා එම ආයතන නගා සිටුවීම, මානව සම්පත් සංවර්ධනය හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම මගින් ආයතනවල ධාරිතාව ඉහළ නැංවීම හා වෙනස් වන තත්වයන්ට අනුකූල වනසේ නීති රීති යාවත්කාලීන කිරීම හා එම කටයුතු නියාමනය ඉහත ප්‍රමුඛ කාර්යයන් වේ.

පසුගිය වකවානුවේ පළාතේ ආර්ථික සංවර්ධනයට ඇතිවූ අහිතකර තත්වයන් වන ගංවතුර, සුළි සුළං, නායයෑම්, මුහුදු ඛාදනය. නියඟය සහ වසංගත රෝග හා ව්‍යසනයන් වැනි අවධානම් සඳහා සාර්ථකව මුහුණ දිමට හැකි වන පරිදි සහ  පළාතේ ඇති සම්පත් හා පිහිටීම අනුව ඉදිරියේ දී ඇතිවිය හැකි නව ප්‍රවනතා ද සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීමට දායක කර ගැනීමේ හැකියාව මෙහිදී සැලකිල්ලට ගනු ලැබීම විශේෂත්වයකි.

මෙම උපාය මාර්ගික සැලැස්මට අනුකූල ඉදිරි වර්ෂ සඳහා වන ක්‍රියාකාරි සැලැසුම් සකස් වන අතර, එම ක්‍රියාකාරී සැලසුම් වෙනස් වන සාමාජීය , ආර්ථික. දේශපාලන හා මූල්‍ය තත්වයන් හමුවේ සංශෝධනය කිරීමේ හැකියාව ඇත. එසේම පළාතේ සියළු පළාත් පාලන ආයතන එක් එක් ආයතන සඳහා තම බල ප්‍රදේශයට ගැලපෙන පරිදි හා මෙම සැලැස්මට අනුගත වනසේ උපාය මාර්ගික සැලසුම් සකස් කිරිම සිදු කළ යුතුව ඇත.

මෙම උපාය මාර්ගික සැලැස්ම සමඟ 2020 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම , වාර්ෂික අයවැය සැලැස්ම සහ කාර්යය සාධන සැලැස්ම සකස් කර ඇත අතර, ක්‍රියාත්මක කිරීමේ දී පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය සහ සියළු පළාත් පාලන ආයතන මගින් සිදු කෙරේ. එසේම අධික්ෂණ කටයුතු සිදු කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුව, ප්‍රධාන අමාත්‍යාංශය හා ප්‍රධාන ලේකම් කාර්යාලය සිදු කරනු ලබන අතර අභ්‍යන්තර හා රජයේ විගණන අංශ මගින් විගණනය කිරිම සිදු වේ.

මෙම සැලැස්ම පලාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා සකස් කර ඇති අතර, ක්‍රියාත්මක කිරීමේ දී සියළු පළාත් පාලන ආයතන, අනෙකුත් පහසුකම් සැලැසීමේ ආයතන හා ඇල්ම පාර්ශව කරුවන්ගේ දායකත්වය ලැබිය යුතු අතර, සියළු කාර්යය මණ්ඩලයේ දායකත්වය ලැබිය යුතුය. මෙය ක්‍රියාත්මක කිරීම මගින් දකුණු පළාතේ මහජනතාවගේ ජීවන තත්වය වර්ථමානයේ ඇති තත්වයට වඩා ඉහළ මට්ටමකට ලඟා කරවීමට හැකි වේ යැයි අපේක්ෂා කෙරේ.

# පටුන


විධායක සාරාංශය

**Executive Summary**

| | | Page No |
|---|---|---|
| Chapter 1 | Corporate Background, Governance, Powers and Functions and Evolution.<br>ආයතනික පසුබිම, පාලනය බලතල සහ කාර්යයන් පරිණාමය | 1-14 |
| Chapter 2 | Strategic Direction<br>උපායමාර්ගික දිශානතීන්. | 15-24 |
| Chapter 3 | Organizational Internal Environment and Situational Analysis<br>ආයතනික අභ්‍යන්තර පරිසරය සහ තත්ව විශ්ලේෂණය | **25-33** |
| Chapter 4 | External Environment Analysis<br>බාහිර පාරිසරික විශ්ලේෂණය | 34-37 |
| Chapter 5 | Performance Review of past Three Years<br>පසුගිය තෙවසරක කාර්යසාධන ඇගයීම | 38-50 |
| Chapter 6 | SWOT Analysis and SWOT Matrix<br>ශදුඅත විශ්ලේශනය | 51-54 |
| Chapter 7 | Arrangements for Implementation<br>ක්‍රියාත්මක කිරීම | 55-62 |
| Chapter 8 | Strategic Review, Evaluation and Control<br>උපාය මාර්ගික සමාලෝචනය, ඇගයීම සහ පාලනය | 63 |

# CHAPTER 1

# CORPORATE BACKGROUND, GOVERNANCE, POWERS, FUNCTIONS AND EVOLUTION

## සංවිධාන පසුබිම,පාලනය,බලතල,

## කාර්යයන් සහ ක්‍රමවේදය

## 1.1 Corporate Background

**සංයුක්ත පසුබිම-**

දක්ෂිණ දේශයේ විශිෂ්ඨත්වය , ජයග්‍රහනය, ආදීන පැවැත්ම , අන්‍යොන්‍ය සහයෝගය, නිර්භයත්වය, ප්‍රවේගීතාවය, ආධිපත්‍ය, ස්ථාවරත්වය, හා ප්‍රපාතවත් බව සංකේතවත් කරමින් ඉලුක් කෝළය රැගත් සිංහයාත්, වසර පහළොස්දහසකට වඩා ඈත අතීතයකට උරුමකම් කියන්නා වූ චිත්තාකර්ෂණීය වර්ණයකින් හා හැඩයකින් යුත් හීන් බෝවිටියා මලත් දකුණේ පෞඩත්වය මැනවින් විදහා පායි. දුටුගැමුණු රජතුමාගේ සටනට මාගම් රාජධානියෙන් පිටත් වූ සටන් පෙරමුණේ ගෙනගිය කොඩියේ සටහන් වූ රක්ත වර්ණයත් සිංහ රූපය සහ රඹ පැහැති වර්ණය සමග දකුණු පළාතේ ඓතිහාසික සංස්කෘතිකමය සමාජමය ආදී සියළු අංශයන් පිළබඳව විමර්ශනාත්මකව සලකා නිර්මාණය වූ රුහුණු ධජය සහ පුෂ්පය දකුණු පළාතේ අනගිමත් සංකේතයයි.

ගාල්ල, මාතර, හම්බන්තොට, යන දිස්ත්‍රික්කයන්ගෙන් සැදුම්ලත් දකුණු පළාතේ අගනගරය වූ ගාල්ල යුනෙස්කෝ සංවිධානය විසින් ලෝක උරුම නගරයක් ලෙස නම් කර ඇත. පුරාණයේ සිටම වෙළඳ නගරයක් ලෙස ප්‍රසිද්ධව පැවති මෙහි ඉන්දියන්සාගරය තුල වූ පිහිටීම නිසා සුවිශේෂී වරායක් හිමිව පැවතුණි. මාතර දිස්ත්‍රික්කයේ මාතර නගරය ප්‍රධාන පරිපාලන නගරය වන අතර එය කෙළඹ සිට කි.මී. 160දුරින් පිහිටා ඇත.හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රධාන වශයෙන් නිවර්තන සහ වියළි කාළගුණයක් සහිත කළාපයක් වන අතර අතීතයේ රුහුණු රට පැවතියේ මෙම ප්‍රදේශය තුලය.

**පළාත් පාලනයේ විකාශය සංස්ථාපනය**

පළාත් පාලන රටක ජනතාවට සමීපතම පාලන ක්‍රමයයි.එය ප්‍රදේශබඳව ක්‍රියාත්මක වන අතර,ඒවාහි බල ප්‍රදේශ නිශ්චිතව වෙන් කරනු ලැබ ඇත.ඒ එක් එක් ප්‍රදේශයට වෙන වෙනම පළාත් පාලන ආයතනයක් බැගින් ස්ථාපනය කොට ඇත.බොහෝ විට එම ආයතන නාගරික හා ග්‍රාමීය වශයෙන්

වෙන්කොට හඳුනාගත හැකිය.මෙම ආයතන පාලනය කරනු ලබන්නේ එක් එක් බල ප්‍රදේශයක් සඳහා එහි ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන නියෝජිතයන්ගෙන් සැදි නෛතිකව බලගැන්වූ සභාවක්(council) මඟිනි.

පළාත් පාලන ආයතනවලට පැවරී ඇති විෂය පථය හා කාර්යභාරයේ ව්‍යාප්තිය හා ස්වාධීනත්වයේ ප්‍රමාණය රටින් රට වෙනස් වේ.සෑම රටකම පළාත් පාලන ආකෘතියේ ස්වභාවය සාධක කීපයක් මත තීරණය වී ඇත.කිසියම් දේශයක ඓතිහාසික සම්ප්‍රදාය,එහි ජනතාවගේ සවිඥාණකත්වය හා සියල්ලටමත් වඩා පළාත් පාලන සංකල්පය කෙරෙහි එරට දේශපාලන හා පරිපාලන ප්‍රභූ පැලැන්තිය තුල ඇති ආකල්ප මීට ඉවහල් වේ.

පළාත් පාලනය බෙහෙවින් දියුණු මට්ටමක පවත්නා බටහිර ලෝකයේ බොහෝ රටවල් විසින් පළාත් පාලන ආයතන වෙත ප්‍රදේශයේ ප්‍රජාවට සේවා සැපයෙන පරිදි පොලිස් සේවාව, අධ්‍යාපනය, සමාජ සේවා, ගමනාගමනය, නිවාස, පරිසර කළමනාකරණය ආදී පුළුල් සේවා රැසක් පවරනු ලැබ ඇත.මහා බ්‍රිතාන්‍ය හා ස්කැන්ඩිනේවියානු රටවල් මෙම රටවල් අතර ප්‍රමුඛ වේ.මෙහි ප්‍රතිවිරුද්ධ අන්තය ලෙසින් පළාත් පාලන ආයතන වෙත ප්‍රමුඛතවයේ ලා නොගැනෙන නිත්‍ය වශයෙන් සීමිත පරාසයක ක්‍රියාකරකම් රජයේ හෝ රාජ්‍යවල දැඩි පාලනය යටත්ව පවරනු ලැබ ඇති අවස්ථා තිබේ.

ඉහත කී ස්වරූපයන් පරිබාහිර වූ වෙනස් ආකාරයකන් සංවිධානය වූ ක්‍රමවේද සෙසු රටවල ක්‍රියාත්මක වේ.ලංකාවේ පළාත් පාලනයේ විකාශනය සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කරන විට අතීතයේ මෙරට පළාත් පාලන ආයතන විෂය පථය හා බලතල සම්බන්ධයෙන් පුළුල් පරාසයක කාර්යභාරයක් සහ සාපේක්ෂ වශයෙන් ඉහල මට්ටමේ ස්වාධීනත්වයක් ද භුක්ති විඳින ලද බව පෙනේ.එහෙත් පසුකාලීනව ඇති වූ ව්‍යවස්ථාමය වෙනස් වීම් හේතුකොට ගෙන වර්තමානයේ මෙරට පළාත් පාලනය සීමිත පරාසයක විහිදීගිය බලතල හා විෂය පථයක් සහිතව ක්‍රියාත්මක වනු දැකිය හැකිය.

කෙසේ වෙතත් කුමන දේශයක හෝ පළාත් පාලනයේ විෂය පථයට ජාතික හෝ ප්‍රාන්ත හෝ පළාත් වලට හිමි විෂයන් අයත් නොවේ.එසේම රටක ආර්ථික සංවර්ධනයට ඍජුවම බලපාන කරුණු ජාතික ආරක්ෂාව,ජාත්‍යාන්තර සබඳතා,පුද්ගල නිදහස.මානව හිමිකම්,සන්නිවේදනය ආදී කරුණු පිළිබඳ බලයක් ජාතික පාලන අධිකාරයන්ට විනා පළාත් පාලනයට අදාල නොවේ.පළාත් පාලනයේ ප්‍රධාන කාර්යය වන්නේ ශිෂ්ඨ සම්පන්න ප්‍රජාවකගේ ගෙදර දොර කටයුතු පහසු කරලීමයි.(Administration of domestic affairs of a civilized society) ජනතාව සිය එදිනෙදා දිවි පෙවත ගෙනයන ප්‍රදේශය පිරිසිදුව සෞඛ්‍ය සම්පන්නව හා ජීවත් වීමට සුදුසු තැනක් බවට පත් කිරිම පළාත් පාලනයට අයත්වන මූලික වගකීම වේ.ඊට

ඉවහල්වන පරිදි නගර පවිත්‍රව තබා ගැනීම,නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම් පාලනය කිරිම හා විධිමත් කිරිම.පීඩා වැලැක්වීම ක්‍රීඩා හා විනෝද පහසුකම් සැලසීම ආදිය පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති කාර්යයන් වේ.

## පළාත් පාලන දෙපාර්තමේන්තුව සංස්ථාපනය

දකුණු පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව සංස්ථාපනය කිරිමට අදාල ප්‍රධාන නීති මූලාශ්‍ර වනුයේ 1978 ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාවට සිදු කරණු ලැබූ 13 වන සංශෝධනය මගින් පළාත් සභා පිහිටුවිමයි.පළාත් පාලන විෂයට අදාලව පළාත් පාලන ආයතන වෙත අවශ්‍ය උපදෙස් දීම, සහය වීම, හා මගපෙන්වීම් සිදු කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ප්‍රධාන අරමුණ වී ඇත.ඒ සඳහා 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු පළාත් පාලන ආයතන සංස්ථාපිත 252 අධිකාරිය වන 1947 අංක 29 දරණ මහා නගර සභා ආඥා පනත, 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත බලය ලැබී ඇත.

මෙම දෙපාර්තමේනතුව මඟින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු මෙසේය.

දකුණු පළාත් බල ප්‍රදේශය තුළ වූ පළාත් පාලන ආයතන වල කටයුතු අධීක්ෂණය කිරීම.

- පළාත් පාලන ආයතන වල කටයුතු උදෙසා උපදේශක සේවා මගින් මග පෙන්වීම.
- පළාත් පාලන ආයතනවලින් ඉටු කෙරෙන මහජන සේවාවන් මැනවින් පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම හා මූල්‍යමය ආධාර සැපයීම.

දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුල ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි ස්ථාපිතව ඇති මහා නගර සභා 03 ක්, නගර සභා 04 ක් සහ ප්‍රාදේශීය සභා 42 තුල මානව සම්පත් සංවර්ධන කටයුතු හා භෞතික සම්පත් සංවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන සඳහා සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක ආයතන මෙහෙයවීම, අධීක්ෂණය හා ඇගයීමත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍යවන මාර්ගෝපදේශ, තාක්ෂණික හා අනෙකුත් සේවාවන් ලබාදෙමින් පළාතේ මහජනතාවට උසස් ජීවන තත්ත්වය ලබා දීමට කටයුතු කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. 2018 වර්ෂයේදී පවත්වන ලද පළාත් පාලන ජන්ද විමසීම මගින් දකුණු පළාත් පළාත් පාලන ආයතන මගින් පුළුල් මහජන සේවාන්

සැපයීම සඳහා මහජන නියෝජිතයින් 1131 ක් පත්ව ඇති අතර, එම කටයුතු සඳහා සහයෝගය ලබා දීම සඳහා හැකියාව සහිත 6373ක් පමණ වන ස්ථිර කාර්ය මණ්ඩලයක් දෛනිකව සේවයේ යෙදෙනු ලබයි.

**ආයතනය පිළිබඳ මූලික තොරතුරු**

- ආයතනයේ නම : පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත
- Department of Local Government, Southern Province
- ලිපිනය : 06 වන මහල, දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලය, ගාල්ල
- ආයතනය අයත් කාණ්ඩය : රජයේ දෙපාර්තමේන්තු
- ආයතනය අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ගාල්ල කඩවත්සතර
- දිස්ත්‍රික්කය : ගාල්ල
- දුරකතන අංකය : 091- 2234797
- ෆැක්ස් අංකය : 091- 2246242
- විද්‍යුත් ලිපිනය : clg_sp@yahoo.com
- වෙබ් අඩවිය : www.localgov.sp.gov.lk
- ආයතන ප්‍රධානියා : පළාත් පාලන කොමසාරිස්
- ආසන්නතම ප්‍රධාන නගරය : ගාල්ල
- ආසන්නතම ප්‍රධාන නගරයේ සිට ආයතනයට ඇති දුර : 100m
- ආයතනය සිදු කරන ප්‍රධාන සේවාවන්

ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල 03 හි හා දකුණු පළාත් පළාත් පාලන ආයතනයන්හි,

- ○ කාර්ය මණ්ඩලය සම්බන්ධ කටයුතු සිදුකිරීම
- ○ ගිණුම් හා ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය සහය වීම
- ○ සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය හා අවශ්‍ය උපදෙස් ලබා දීම
- ○ පළාත් පාලන ආයතනයන්හි සිදු වන කටයුතු අධීක්ෂණය හා මග පෙන්වීම

- ආයතනය අයත්වන අමාත්‍යාංශය : ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත
- පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන :

○ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය - ගාල්ල

○ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය - මාතර

○ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය - හම්බන්තොට

○ තත්ව පරීක්ෂණාගාරය ගාල්ල, මාතර

○ මොන්රෝවියාවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය රජ්ගම

○ පළාත් පාලන ආයතන - 49

- ○ මහනගර සභා - 03
- ○ නගර සභා -04
- ○ ප්‍රාදේශීය සභා 42

- ආයතනයතුල පවතින අංශ : සංවර්ධන අංශය
  ආයතන අංශය
  ගිණුම් අංශය
  විමර්ශන අංශය

දකුණු පළාතේ ජනතාවට වඩාත් ඉහළ ඵලදායී සේවාවක් ඉටුකිරීම සඳහා පළාත් පාලන ආයතනයන්හි සේවයේ නියුතු කාර්ය මණ්ඩලයෙහි කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන අතර දැනුම බෙදා ගැනීමේ මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහාත්, ආසියා පදනමේ මූල්‍ය හා තාක්ෂණ අනුග්‍රහය සහිතව පළාත් පාලන දෙපාර්තමේන්තු කාර්යාලයේ පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානය හා දක්ෂිණ පාය අමාත්‍යාංශ සංකීර්ණයෙහි 06 වන මහළ තුල පළාත් පාලන සම්පත් පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අතර, එමගින් පළාත් පාලන ආයතන උදෙසා 2017 හා 2018 වර්ෂයන් තුල දී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිතව ඇති මහා නගර සභා 03, නගර සභා 04 සහ ප්‍රාදේශීය සභා 42 තුළ සංවර්ධන කටයුතු සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන මගින් එම කාර්යයන් ඉටු කිරීම සඳහා එම ආයතන මෙහෙයවීම, මග පෙන්වීම, උපදෙස් දීම, අධීක්ෂණ කටයුතු සිදු කිරීම හා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමත්, තාක්ෂණික සේවාවන් හා අනෙකුත් සේවාවන් ලබාදෙමින් පළාතේ මහජනතාවට ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩා යහපත් කර ගැනීමට කටයුතු කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

## 1.2 Governance of CLG
## පාලනය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු කාර්යක්ෂමව, විනිවිධභාවයකින් යුක්තව සිදු කිරීම සඳහා බලතල සහ වගකීම් ඉහළ සිට පහළට විධිමත්ව බෙදා ඇත. පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල, පලාත් පාලන ආයතනයන්හි සමස්ත කාර්ය මණ්ඩලය 4771 කි.

මෙහිදී පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ  පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල වල සේවක මණ්ඩලය පහත ආකාරයෙන් දැක්විය හැක.

## 2020.01.01 දිනට අනුමත කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක | පළාත් පාලන කොමසාරිස් | 1 | 1 |
| | නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් | 1 | 1 |
| | සහකාර/ නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් | 3 | 3 |
| | සහකාර පළාත් පාලන කොමසාරිස් | 1 | 0 |
| | ගණකාධිකාරී | 1 | 1 |
| | ඉංජිනේරු (සිවිල්) | 4 | 4 |
| | ඉංජිනේරු (යාන්ත්‍රික) | 1 | 1 |
| මාණ්ඩලික | පරිපාලන නිලධාරි | 1 | 1 |
| | තාක්ෂණ නිලධාරී (සිවිල්) | 8 | 4 |
| | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී | 3 | 0 |
| | ජ්‍යෙෂ්ඨ ප්‍රජා සංවර්ධන නිලධාරී | 3 | 0 |
| ද්විතීක | විමර්ශන නිලධාරී | 25 | 22 |
| | ප්‍රජා සංවර්ධන නිලධාරී | 49 | 38 |
| | සංවර්ධන නිලධාරී | 48 | 47 |
| | සැලසුම් ශිල්පි | 4 | 4 |
| | කළමනාකරණ සහකාර | 24 | 23 |
| ප්‍රාථමික | තොරතුරු තාක්ෂණ සහාකාර | 0 | 2 |
| | කාර්යාල කාර්ය සහායක | 6 | 6 |
| | සෞඛ්‍ය කම්කරු | 1 | 1 |
| | රියදුරු | 9 | 7 |

| | | | |
|---|---|---|---|
| | **එකතුව** | **193** | **166** |
| | **තනතුර** | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව |
| **මොන්රෝවියාවත්ත කසළ කළමනාකරණ ව්‍යාපෘතිය** | | | |
| | සණ අපද්‍රව්‍ය මධ්‍යස්ථාන භාරකරු | 1 | 0 |
| කොන්ත්‍රාත් | රියදුරු | 1 | 0 |
| | යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 0 |
| | සෞඛ්‍ය කම්කරු | 13 | 11 |
| | **එකතුව** | **17** | **11** |
| | | | |
| **තත්ව පාලන අංශය** | | | |
| | තාක්ෂණ නිලධාරි (සිවිල්) | 2 | 2 |
| | පරික්ෂණගාර සහායක | 4 | 1 |
| | රියදුරු | 2 | 0 |
| | **එකතුව** | **8** | **3** |
| | | | |
| 25/2014 දරන්නාට පෞද්ගලික වන | | | |
| | මුරකරු* | 3 | 3 |
| | ආරක්ෂක නියාමක* | 3 | 3 |
| | වැඩ/ක්ෂේත්‍ර කම්කරු* | 9 | 9 |
| | රියදුරු* | 1 | 1 |
| | පරීක්ෂණාගාර උදව්කරු* | 3 | 3 |
| | වැඩ පරික්ෂක* | 1 | 1 |
| | පරික්ෂණාගාර තාක්ෂණ ශිල්පී | 1 | 1 |
| | **එකතුව** | **21** | **21** |
| **එකතුව** | | **239** | **201** |

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් , නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් සහ සහකාර පළාත් පාලන කොමසාරිස්වරු තිදෙනෙකුගෙන් යුක්තව ආයතනය පාලනය වේ.ජ්‍යෝෂ්ඨ නායකත්වය විසින් නිශ්චිත කාල පරාසවලින් කාර්ය පල සමාලෝචනය හා ප්‍රති පෝෂණය කරමින් ආයතනය පාලනය සිදු කරණු ලබයි. මාණ්ඩලික නිලධාරී රැස්වීම් පවත්වා ඔවුන්ට ඉලක්ක ලබා දීමත්, සහකාර කොමසාරිස්වරුන් සමග පවත්වනු ලබන රැස්වීම තුළින් අවශ්‍ය තීරණ ලබා දීමත්, සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මාසිකව හා කාර්තුමය වශයෙන් සොයා බැලීම හා රැස්වීම් පවත්වා ලබා ඇති ප්‍රගතිය හෝ ඌනතාවය සම්බන්ධව ඇගයීම හෝ උපදෙස් ලබා දීම සිදු කිරීමත්, ආයතනයේ සියළු අංශ නිරීක්ෂණය කොට රාජකාරී කටයුතු පිළිබඳ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමත් මෙහිදී සිදු වේ.

එමෙන්ම කාර්යමණ්ඩලය අතර යහපත් සංවාදයක් පවත්වා ගනිමින් සංවිධාන පද්ධතිය මනාව පලනය කිරීමක් සිදු කරනු ලබයි. පළාත් පාලන කොමසාරිස්තුමා හා ඉහල නායකත්වය සමග දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය අදහස්, යෝජනා හා තොරතුරු හුවමාරු කර ගනිමින් කාර්යමණ්ඩල රැස්වීම් පැවැත්වීම, රාජකාරි සම්බන්ධ වගකීම් හා බලතල පහළ නිලධාරීන් වෙත රාජකාරි කළහැකි පරිදි ලබා දීම, ආයතන ප්‍රධානීන් ඒ ඒ අංශ කැදවා සාකච්ජා කර අවශ්‍ය අවස්ථාවන් සඳහා මග පෙන්වීම ලබා දීම, නිලධාරීන් විවිධ විෂයයන් හා අංශ අතර අභ්‍යන්තර ස්ථාන මාරුකිරීම් මගින් ආයතනයේ සෑම අංශයකම හා විෂයයන් පිළිබඳව රාජකාරී අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙමින් දෙපාර්තමේන්තු අභ්‍යන්තර පාලනයක් සිදු කරනු ලබයි.

## 1.3 **Objects, Powers, and Functions**

### අරමුණු , බලතල සහ ක්‍රියාකාරිත්වය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අරමුණු පහත ආකාරයෙන් පෙන්වා දිය හැක.

- දකුණු පළාතේ පළාත් පාලන බල ප්‍රදේශ තුල පොදු යටිතල පහසුකම් හා පොදු උපයෝගීතා සේවා සංවර්ධනය කිරීමට අවශ්‍ය මූල්‍යමය, තාක්ෂණික හා මානව සම්පත් සහයෝගීතාවය ලබාදීම තුලින් පළාත තුල පොදු යටිතල පහසුකම් පද්ධතිය වැඩිදියුණු කිරීම.
- පුහුණුව හා සංවර්ධන උපායමාර්ග තුලින් පළාත් පාලන අයතන තුල සිටින මහජන නියෝජිතයින් හා කාර්යමණ්ඩලය යාවත්කාලීන දැනුම් කුසලතා හා ධනාත්මක ආකල්ප සහිත වැඩකණ්ඩායමක් බවට පත්කිරීම තුලින් ආයතනික ඵලදාදීතාවය ඉලළ නැංවීම.

- පළාත් පාලන ආයතන වෙත සපයනු ලබන සේවාවන් පරිඝනක හා අන්තර්ජාලය සමග සම්බන්ධ කිරීම මගින් එම සේවාවන්හි කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම.
- දකුණු පළාතේ සියලු පළාත් පාලන ආයතනයන්ට පොදු නීතිමය රාමුවකට අනුගත වීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම මගින් කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහලනැංවීම.
- දකුණු පළාතේ පළාත් පාලන ආයතන තුල ඝන අපද්‍රව්‍ය කළමණාකරන ක්ෂේත්‍රයේ ගැටළු සඳහා විසඳුම් ලබාදීමට සහාය වීම තුලින් විධිමත් කසල කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- පළාත් පාලන ආයතන විසින් සපයනු ලබන සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවාවන් සඳහා අවශ්‍ය පහසුකම් සැකසීම තුලින් දකුණු පළාතේ සෞඛ්‍ය දර්ශක ඉහල නැංවීමට දායක වීම.
- පළාත්පාලන ආයතනවල මහජන සේවා සම්පාදන ක්‍රියාවලිය පවතින රාජ්‍ය ප්‍රතිපත්තියට හා පළාත් පාලන නීතිරීති වලට අනුකූල කිරීම මගින් අල්ලස හා දූෂණය හා නාස්තිය පිටුදකින කාර්යක්ෂම හා විශ්වාසදායී රාජ්‍ය සේවාවක් දකුණු පළාතේ මහජනතාවට ලබා දීම.

- පළාත් පාලන ආයතන මගින් මහජනතාවට සිදුවන අකටයුතුකම් (කිරීමක් හෝ නොකිරීමෙන්) හේතුවෙන් අවශ්‍ය නිති උපදේශක සේවා ඒකකයක් ස්ථාපිත කිරීම මගින් මහජනතාවට සිදුවන පීඩාවන් අවම කිරීම.
- දිස්ත්‍රික් මට්ටටමේ පළාත් පාලන කාර්යාල තුන බලතල හා වගකීම් පැවරීම තුලින් පළාත් පාලන ආයතන වලට වඩාත් සමීපතම ඒකකය ලෙස බල ගැන්වීම.

පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන වශයෙන්ම බලාධිකාරය ලැබෙනුයේ 1947 අංක 29 දරණ මහා නගර සභා ආඥා පනත, 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යන පනත් මගිනි. මීට අමතරව 1989 අංක 12 දරණ පළාත් සභා ආනුශංගික විධිවිධාන පනත මඟින් ද බලය පවරා ඇත.

පළාත් පාලන ආයතන පොදු පරිපාලන ක්‍රමවේදයකට ගෙන ඒම සඳහා නීති- රීති හා මාර්ගෝපදේශන සංග්‍රහය සැකසීම හා සංශෝධනය කිරීම සිදු වේ. මෙහිදී වීථි ආලෝක කරන/ කඩ බදු අය කිරීම් ආදී අංශ 10ක් පමණ සඳහා පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ සැකසීම,පළාත් පාලන ආයතන මූල්‍ය හා පරිපාලන රීති සංශෝධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම,පළාත් පාලන ආයතන සඳහා අතුරු ව්‍යවස්ථා සැකසීම දැක්විය හැක.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පහත වකවාණුවලදී සිදු වූ විශේෂිත සිදුවීම් මෙලෙසින් දැක්විය හැක.

| | | |
|---|---|---|
| 01 | මාතර ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරය ආරම්භ කිරිම | 2010 |
| 02 | මොන්රෝවියාවත්ත කසළ කළමණාකරන ඒකකය ආරම්භ කිරීම | 2012 |
| 03 | ගාල්ල ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරය ආරම්භ කිරිම | 2012 |
| 04 | රජයේ ආයතනවල ආදර්ශ කාබනික ගෙවතු ස්ථාපිත කිරීම සඳහා නොමිලේ කොම්පෝස්ට් පොහොර ලබා දීම | 2015 -2020 |
| 05 | ඊ පුරනැගුම Front Office Software පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදිම | 2015 |

| | | |
|---|---|---|
| 06 | දකුණු පළාත් ඝන අපද්‍රව්‍ය කළමණාකරනය දිරිමත් කිරීම සඳහා රජයේ ආයතන සහ ජනතාව සඳහා ප්ලාස්ටික් කොම්පෝස්ට් බඳුන් ,  කසළ වෙන් කිරීමේ බඳුන් ලබා දීම | 2016/2017 |
| 07 | තෝරා ගත් පළාත් පාලන ආයතන සඳහා ළිං ඉසින යන්ත ලබා දීම | 2017 |
| 08 | පළාත් පාලන ආයතන යටතේ ඇති සියළුම මහජන පුස්තකාල සඳහා මිලියන 15ක් වටිනා පොත් ලබා දීම | 2018 |
| 09 | පළාත් පාලන ආයතන යටතේ ඇති සියළුම ආර්යුවේද  මධ්‍යස්ථාන  වලට මූලික පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම. | 2018 |
| 10 | තංගල්ල නගර සභාව, බලපිටිය  ප්‍රාදේශීය සභාව, දික්වැල්ල  ප්‍රාදේශීය සභාව, ආදියෙහි පෙරපාසල් ආදර්ශ පෙරපාසල් ලෙස නවීකරණය | 2018 |
| 11 | සියළුම පළාත් පාලන ආයතන සඳහා ප්ලාස්ටික් ජල ටැංකි ලබා දීම | 2018-2020 |
| 12 | ගොඩනැගිලි සායනයක් පැවැත්වීම | 2018 |
| 13 | දෙපාර්තමේන්තුව සඳහා  නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් තනතුරක් අනුමත කර ගැනීම | 2019 |
| 14 | පළාත් පාලන ආයතන සඳහා  SW Maps phone app යොදා ගැනීමට කටයුතු කිරීම | 2020 |
| 15 | පළාත් පාලන ආයතන  වත්කම් කළමනාකරණ කටයුතු සඳහා CAMS Software යොදා ගැනීමට කටයුතු කිරීම | 2020 |
| 16 | පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම | 2020 |

## පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණය ක්‍රියාත්මක වීම

ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා විශාල සමාජ පරිවර්තනයක් සිදු කරමින් නව්‍යකරණ සංස්කෘතියක් ගොඩනැගෙමින් පවතී. මෙහිදි ජනතාවගේ පහසුව පිණිස ජනතා කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍ය තන්ත්‍රයක් බිහි වෙමින් පවතී. නව තාක්ෂණය අනුගත කිරීම තුලින් රාජ්‍ය යාන්ත්‍රයේ පවතින අකාර්යක්ෂම බව සහ ප්‍රමාධයන් වලකා ගැනීම පිණිස අන්තර්ජාලය හරහා සේවා සැපයීම සහ එම සේවාවන් පිළිබඳව අවශ්‍ය උපදෙස් සහ පුහුණුව පළාත් පාලන ආයතනවලට ලබා දීම පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදු වේ.

- සියළු පළාත් පාලන ආයතන සඳහා වෙබ් පිටුවක් පැවතීම

සෑම පළාත් පාලන ආයතනයකම වෙබ් පිටුව හරහා තොරතුරු දැනගැනීමේ පනතට අනුව ප්‍ාමී තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.මෙහිදී පළාත් පාලන ආයතන වාර්ෂික සැලැස්ම ඉදිරිපත්කිරීම, මහජනතාවට අදාල සියළු තොරතුරු ලබා දීම, අන්තර්ජාලය හරහා තොරතුරු ලබා ගැනීම සඳහා මහජනතාවට පහසුකම් සැලසීම සිදු වේ.

- ඊ පුරනැගුම වැඩසටහන යටතේ පෙරටු කාර්යාල ක්‍රම හඳුන්වා දීම

පළාත් පාලන ආයතන සේවාලාභීන්ගේ පහසුව සඳහා ක්‍රියාත්මක කර ඇති මෙම සේවාව තුලින් පළාත් පාලන ආයතන වලට අවශ්‍ය දෛනික වාර්තා පරිසනකගත වේ. පැමිණිළි කළමනාකරණය, අයදුම්පත් කළමනාකරණය, සියළුම ආදායම් සඳහා රිසිට්පත් නිකුත් කිරීම, වරිපනම් කළමනාකරණය, පුස්තකාල කළමනාකරණය ආදිය මෙම ක්‍රමය තුල ක්‍රියාත්මක වේ.

- පළාත් පාලන ආයතන සඳහා SW MAP APP හඳුන්වාදීම.

2020 වසරේදී මෙම SW MAP APP ජංගම දුරකතන ඇප් එක පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදීම සිදුවිය. ප්‍රාදේශීයසභා බල ප්‍රදේශ මායිම් වෙන් කිරීමට මෙන්ම ඒවාහි අදාල දත්ත හා තොරතුරු පද්ධතියට ස්වයංක්‍රීයව ඇතුලත් කර ගැනීම මෙහිදී සිදු වේ. මේ පිළිබඳ පුහුණුවකින් පසු පළාත් පාලන ආයතන කිහිපයක මෙම කටයුතු සිදු කරමින් පවතී.

- වත්කම් සහ පිරිවැය කළමනාකරණය සඳහා CAMS මෘදුකාංගය හඳුන්වාදීම.

මෙහෙයුම් කටයුතු සඳහා උපරිම සඵලතාවයකින් වත්කම් උපයෝගී කර ගැනීම , වත්කම් නිසි පරිදි නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම මෙන්ම පිරිවැය කළමනාකරණය පදනම් කර වත්කම් අපහරණය සඳහා විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීම සඳහා මෙම මෘදුකාංගය භාවිතය වැදගත් වේ. 2020 වසරේ සිට මෙම මෘදුකාංගය පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදීම සිදුවිය.

# CHAPTER 2

# STRATEGIC DIRECTIONS

## උපායමාර්ගික දිශානතිය

## 2.1 Our Mission

### අපගේ මෙහෙවර

මහජනතාවගේ අභිලාශයන් තෘප්තිමත් කිරීමට පළාත් පාලන ආයතනවලට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සහ මූල්‍ය, තාක්ෂණික, සහයෝගීතාවය සම්බන්ධීකරණය තුලින් නවෝත්පාදක පළාත්පාලනයක් දකුණු පළාත තුල ස්ථාපිත කිරීම.

## 2.2Our Vision

### අපගේ දැක්ම

මහජන කේන්ද්‍රීය පළාත් පාලනකය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛයා වීම.

Becoming the leader of citizen centric local governance in Sri Lanka.

## 2.3 **Our Key Performance Indicators(KPIs)** **ප්‍රධාන කාර්යසාධන මිණුම්**

| අංශය | වර්ෂ 2024 දී ලඟා කර ගැනීමට නියමිත ප්‍රමාණය | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| නව මාර්ග සංවර්ධනය වාර්ෂිකව (කි.මී.) | 100 | 20 | 20 | 20 | 20 | 20 |
| මාර්ග නඩත්තුව වාර්ෂිකව (කි.මී) | 100 | 20 | 20 | 20 | 20 | 20 |
| පැති කාණු සංවර්ධනය වාර්ෂිකව (මී.) | 5000 | 1000 | 1000 | 1000 | 1000 | 1000 |
| පැති බැමි සංවර්ධනය වාර්ෂිකව (මී.) | 5000- | 1000 | 1000 | 1000 | 1000 | 1000 |
| වාර්ෂිකව පානීය ජල සැපයුම (ප්‍රතිලාභී පවුල් ගණන) | 1250 | 250 | 250 | 250 | 250 | 250 |
| පෙර පාසල්. පුස්තකාල හා ආයුර්වේද සේවාලාභී තෘප්තිය ඉහල නැංවීම ප්‍රතිශතය | 100% | 60% | 70% | 80% | 90% | 100% |
| ළමා මරණ . මාතෘ මරණහා වසංගත රෝග මරණ අනුපාතය අවම වන පරිදි සේවා සැපයීම ඉහළ නැංවීම | 100% | 60% | 70% | 80% | 90% | 100% |
| පළාත් පාලන ආයතන මගින් සපයන පොදු උපයෝගීතා සේවාවන් හි ප්‍රතිලාභී තෘප්තිය ඉහළ නැංවීම | 100% | 60% | 70% | 80% | 90% | 100% |
| ආපදා සහ අවධානම් සහිත තත්වයන් සඳහා වන අවස්ථා අවම කිරීම | 0% | 50% | 40% | 30% | 20% | 0% |
| පළාත් පාලන ආයතන සතු ස්වයං ආදායම් උත්පාදන හැකියාව ඉහළ නැංවීම | 100% | 60% | 70% | 80% | 90% | 100% |
| ඊ - තාක්ෂණය යොදා ගැනීම මගින් සේවා සැපයීමේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම | 100% | 40% | 60% | 80% | 90% | 100 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කාර්යය මණ්ඩල පුහුණු අවශ්‍යතා සපිරීම | 100% | 40% | 60% | 80% | 90% | 100% |
| කාර්යය මණ්ඩල තෘප්තිය ඉහළ නැංවීම | 100% | 40% | 60% | 80% | 90% | 100% |
| නීති රීති හා අන පනත් යාවත්කාලීන කිරිම | 100% | 50% | 70% | 80% | 90% | 100% |

## 2.4 Our Corporate Goals

### අපගේ සංවිධානමය අභිමතාර්ථ

1. පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය

- පළාත් පාලන මාර්ග සංවර්ධනය

  නව පාරවල් ඉදි කිරීම.

  පාරවල් නඩත්තුව

  පැති කාණු ඉදිකිරීම

  පැති බැම් ඉදිකිරීම

- ප්‍රජා ජල සම්පාදන පහසුකම්, සනීපාරක්ෂක ජල සැපයුම් ඇති කිරීම
- පුස්තකාල සංවර්ධනය
- ක්‍රීඩා පිටි සංවර්ධනය
- ආදාහනාගාර සහ සුසානභූමි සංවර්ධනය
- ආයුර්වේද මධ්‍යස්ථාන සංවර්ධනය
- පෙර පාසල් සංවර්ධනය

02. සනීපාරක්ෂක පහසුකම් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

- කසළ කළමනාකරණය

- බැහැර කිරීමේ ද්‍රව්‍ය අවම කිරීම
- තිරසර පාරිසරික නඩත්තුව
- ඩෙංගු සහ වෙනත් බෝවන රෝග පාලනය
- මල අපද්‍රව්‍ය කළමනාකරණය

03.පළාත් පාලන ආයතන නගා සිටුවීම

- අධ්‍යාපන පහසුකම් සංවර්ධනය
- ළමා හා පූර්ව ළමා විය සංවර්ධනය
- මහජන සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වීම
- පොදු පහසුකම් වැඩිදියුණු කිරීම
- වෙනත් ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීම

04.මානව සම්පත් සංවර්ධනය සහ ආයතන ශක්තිමත් කිරීම

- කාර්යය මණ්ඩල පුහුණුව
- කාර්යය මණ්ඩල සංශෝධනය
- මහජන නියෝජිතයින් පුහුණුව හා දැනුවත් කිරීම
- ආයතන පහසුකම් වැඩි දියුණු කිරීම (පරිගණක,මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ....)

05.තිරසර පුරවර ඇති කිරීම

- හරිත මාවත් හා ඇවිදින මංතීරු ස්ථාපිත කිරීම
- කසළ දාහක ස්ථාපනය
- විනෝද උද්‍යාන සංවර්ධනය
- මළ අපද්‍රව්‍ය පිරිපහදු මධ්‍යස්ථාන
- සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථාපනය

- අප ජලය පිරිපහදු මධ්‍යස්ථාන
- ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන
- වෙළඳ සංකීර්ණ
- ආපදා කළමනාකරණය
- ඊ සේවාවවන් ව්‍යාප්ත කිරීම

06.නීති රෙගුලාසි අංශ යාවත්කාලීන කිරීම හා නියාමනය

- 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංශෝධනය
- පළාත් පාලන ආයතන සඳහා අත්‍යාවශ්‍ය ආඥා පනත් හා පනත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රදර්ශනය
- චක්‍රලේඛ යාවත්කාලීන කිරීම
- අතුරු ව්‍යස්ථා සැකසීම
- ඉදිකිරීම් තත්ව නියාමනය (තාක්ෂණික පරීක්ෂණාගාර)

**පළාත් පාලන විෂය තුළ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සපුරාගත් තිරසර සංවර්ධන අරමුණු 13 කි. එනම්**

01.සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

02පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම

03.සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් කාණ්ඩයක් සඳහාම ශරීර සුවතාවය වර්ධනය කිරීම (Good Health)

04.ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය ළගාකර ගැනීම සහ සියළු කාන්තාවන් සහ දැරියන් සවිබල ගැන්වීම (Gender Equality)

05.සියළු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය සහ තිරසාර ජල සහ සනීපාරක්ෂාව කළමනාකරණය සුරක්ෂිත කිරීම (Clean water and sanitation)

06.සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම

07.තිරසාර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම (Economic growth)

8. නම්‍යශීලි යටිතල පහසුකම් සංවර්ධනය (Infrastructure)


9. නගර සහ මානව සම්පත, පදිංචි කිරීම් පරිපූර්ණ,තිරිසාර,නම්‍යශීලි හා ආරක්ෂිත කිරීම (Sustainable cities and Communities)

10. තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා සුරක්ෂිත කිරීම (Responsible Consumption)

11. කාලගුණ විෂමතාවලට එරෙහිව කටයුතු කිරීමත් එහි බලපෑම්වලට එරෙහිව කටයුතු කිරීමත් එහි බලපෑම්වලට කඩිනම් පියවර ගැනීම. (Climate action)

12. මුහුදු සහ සාගර මූලාශ්‍ර හා සම්පත් තිරසාර සංවර්ධනය සඳහා සංරක්ෂණය කරමින් තිරසාරව භාවිතාකිරීම (Life below water)

13. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම සහ ප්‍රතිසංස්කරණය තිරසාර භාවිතය සඳහා ප්‍රවර්ධනය කිරීම (Life on Land)


1 NO POVERTY
3 GOOD HEALTH AND WELL-BEING
4 QUALITY EDUCATION
5 GENDER EQUALITY
6 CLEAN WATER AND SANITATION
17 PARTNERSHIPS FOR THE GOALS
2 ZERO HUNGER
8 DECENT WORK AND ECONOMIC GROWTH
7 AFFORDABLE AND CLEAN ENERGY
පළාත් පාලන විෂය තුල පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සපුරා ගත් තිරසාර සංවර්ධන අභිමතාර්ථ
9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE
16 PEACE, JUSTICE AND STRONG INSTITUTIONS
15 LIFE ON LAND
14 LIFE BELOW WATER
13 CLIMATE ACTION
12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION
11 SUSTAINABLE CITIES AND COMMUNITIES
10 REDUCED INEQUALITIES

## 2.5 Our Corporate Strategies

### අපගේ සංවිධාන උපායමාර්ග

- පළාත් සභාව මගින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ මන්ත්‍රී ප්‍රතිපාදන.
- මුදල් කොමිසන් සභාව මගින් ලැබෙන උපමාන පාදක සංවර්ධන ප්‍රදාන ප්‍රතිපාදන පළාත් පාලන ආයතන සමග සම්බන්ධ වීම.
- රේඛීය අමාත්‍යාංශ හා මධ්‍යම පරිසර අධිකාරිය වැනි රාජ්‍ය ආයතන සහ අනුබද්ධිත ආයතන වලින් ලැබෙන ප්‍රතිපාදන හා යොමු කිරීම.
- පළාත් පාලන ආයතන වලින් හඳුනාගත් ව්‍යාපෘති වාර්තා සඳහා අදාළ අංශ වෙත යොමු කර ප්‍රතිපාදන ලබා ගැනීම.
- රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලික අංශය වෙතින් ලැබෙන ප්‍රතිපාදන සඳහා සුදුසු ව්‍යාපෘති හඳුනා ගැනීම.
- පළාත් පාලන ආයතන වල සමාජ උත්පාදන ආදායම් වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම හා ව්‍යාපෘති කරවීමට උනන්දු කිරීම.
- රාජ්‍ය අංශය හා පුද්ගලික අංශය සහභාගීත්ව අවස්ථා හඳුනාගැනීම සහ ප්‍රජා දායකත්ව ව්‍යාපෘති සඳහා පළාත් පාලන ආයතන දිරිගැන්වීම.
- දෙස් විදෙස් පුහුණු අවස්ථාවන් පළාත් පාලන කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය යොමු කිරීම.

## 2.6 Our Guiding Principles- Core Values

### අපගේ මූලධර්ම_ - අපගේ අගයන්

- සාධාරණත්වය - තීරණ ගැනීමේදී සහ සම්පත් බෙදාහැරීමේදී සාධාරණත්වය හා අවංකභාවය රැකෙන පරිදි කටයුතු කිරීම.

- වගවීම - කාර්ය පටිපාටිය සහ ක්‍රියාකාරීත්ව පිළිබඳව සියළුම ගනුදෙනුකරුවන් සඳහා විවෘතව සහ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීම. අපගේ ක්‍රියාකාරකම්වලට පාදක වූ කරුණු පැහැදිලි කිරීමට සූදානමින් සිටීම මහජනතාව, රජය සහ කාර්යය මණ්ඩලය වෙත වග කීමට බැඳී සිටීම


- සන්නිවේදනය - ප්‍රධාන සහභාගීවන්නන් සමඟ සහයෝගීව ක්‍රියාකරමින්, අදහස් හුවමාරු කරගනිමින් සහ උපදෙස් ලබා ගනිමින් නවීන සන්නිවේදන ක්‍රම සමග කඩිනමින් සම්බන්ධ වී ඵලදායි ලෙස කටයුතු කිරීම.

- කැපවීම - මඟ පෙන්වමින් සහ කාර්ය ඵලයෙහි නිරන්තර අභිවෘද්ධිය සඳහා ධෛර්යමත් කිරීම, අවශ්‍යතාවයන් අනුව ක්ෂණිකව තම සේවාවන් සැපයීම, එදිනෙදා රාජකාරී කටයුතුවල දී තම සේවය අවශ්‍යතාවය පරිදි ඕනෑම කාර්යයක නියැලීමේ හැකියාව.

- සහභාගීත්වය - සියළුම සහභාගීවන්නන් සමඟ සඵලදායි සම්බන්ධතාවයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය අනුග්‍රහ සැපයීම, රාජකාරීමය හා රාජකාරීමය නොවන සුභසාධන කටයුතුවල දී ස්වේච්ඡාවෙන් ම සිය සේවය ලබා දීම.

- පුරවැසි කේන්ද්‍රීය බව - මහජන මුදල් හා සම්පත් ප්‍රමුඛ මහජන අවශ්‍යතා ඉටවන ලෙස කාර්යක්ෂමව යෙදවීම.

- වෘත්තීය නිපුණත්වය - සියලු කටයුතු කැපවීමෙන්, ගුණාත්මකභාවයෙන් සහ විශිෂ්ටත්වයෙන් යුතු ව සිදු කිරීම.



සාධාරණත්වය
වගවීම
සන්නිවේදනය
Our Guiding Principles- Core Values
අපගේ මූලධර්ම- අපගේ අගයන්
වෘත්තීය නිපුනත්වය
පුරවැසි කේන්ද්‍රීය බව
සහභාගීත්වය
කැපවීම
TEAM
WORK

# CHAPTER 3

# ORGANIZATIONAL INTERNAL ENVIRONMENT AND SITUATIONAL ANALYSIS

## සංවිධාන අභ්‍යන්තර පරිසරය සහ තත්ව විශ්ලේෂණය

## 3.1 **Organization Structure** **සංවිධාන ව්‍යුහය**



පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි ආයතන අංශය මගින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙහි, සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල තුනෙහි, සියළුම පළාත් පාලන ආයතන වල සේවය කරනු ලබන සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොණු සම්බන්ධ ආයතන කටයුතු, දෛනික තැපැල සම්බන්ධ කටයුතු, අනුමත කාර්ය මණ්ඩලය සහ සේවක සංඛ තොරතුරු, අනියම් ආදේශක බඳවා ගැනිම් කටයුතු, විදේශ නිවාඩු, අතිකාල / දිනවැටුප් නිවාඩු සම්බන්ධ කටයුතු ආදී ආයතනයේ සියළු පරිපාලන කටයුතු සිදු වේ.

සංවර්ධන අංශය යටතේ ප්‍රධාන වශයෙන් පළාත් සංවර්ධන සැලැස්ම සකස් කරමින් අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර අනුමතවූ පසු අදාල කර්මාන්ත ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට දැණුම් දීම සිදු කරණු ලබයි. ඒවාට අදාල ලේඛණ ගෙන්වා පරීක්ෂා කිරීමත්, ඒ සම්හන්ධයෙන් අධීක්ෂණය කර බිල් ගෙවීම් සම්හන්ධ කටයුතුත් මෙහිදී සිදු වේ. පළාත් පාලන ආයතනවලට සම්හන්ධ සියළුම සංවර්ධන කටයුතු මෙහිදී අවධානයට ලක් කෙරේ. සංවර්ධන ව්‍යාපෘති මගින් පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සිදුකර ඇත. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතීන් මෙහිදී ඉතා වැදගත් වේ. මේ අතර නව පාරවල් ඉදි කිරිම හා නඩත්තු කිරීම, සනීපාරක්ෂක ජල සැපයුම, ආදාහනාගාර හා සුසාන භූමි සංවර්ධනය , පුස්තකාල පහසුකම් සැපයීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය , පූර්ව ළමා විය සංවර්ධනය , පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධනය, සතිපොළ සංවර්ධනය , පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධනය , පළාත් පාලන වෙනත් සේවා ආදිය මගින් සංවර්ධන අංශයේ කටයුතු සිදු කරනු ලබයි.

ගිණුම් අංශය යටතේ පළාත් පාලන ආයතන හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලවල වැටුප් සැකසීම , පළාත් පාලන වැටුප් ප්‍රතිපූරණය , බැංකු සැසඳුම් පිළියෙළ කිරීම , රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් , සැපයුම් හා සේවා , දේපල ණය , අග්‍රහාර රක්ෂණ, වරිපනම් බදු අනුමැතිය, වවුචර් පරීක්ෂාව, විගණන විමසුම්, අත්තිකාරම් හා බැරකම් ආදිය පිළිබඳව කටයුතු සිදු කිරීම, පළාත් සභා ගිණුම් සාරාංශය, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම, කාර්ය සාධන වාර්තාව සැකසීම, සුළු මුදල් අග්‍රිමය පවත්වාගෙන යාම, වැටුප් වැඩිවීම් ගෙවීම් පරීක්ෂා කිරීම,බලතල පැවරීම සැකසීම,විගණන කළමණාකරණ කමිටු පැවැත්වීමට අදාළ කටයුතු, සියලුම වැය ශීර්ෂ සඳහා වන ප්‍රතිපාදන හා වියදම් ලෙජර්ගත කිරීම, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම, ප්‍රතිපාදන ඉල්ලීම හා අදාළ විෂයන් වෙත ප්‍රතිපාදන නිකුත් කිරීම, ප.පා ආයතන වල ආදායම් වාර්තාව පිළියෙල කිරීම, වවුචර් ලිවීම, චෙක්පත් ප පා ආයතනවලට යොමු කිරීම, මුදල් හා චෙක්පත් ලබා ගැනීම, වැය අනුමැතිය, පොදු තැන්පත් ගිණුම පවත්වාගෙන යාම ආදී කටයුතු සිදු වේ.

විමර්ශන අංශය මගින් දකුණු පළාතේ පළාත් පාලන ආයතන වල කටයුතු උදෙසා උපදේශක සේවා මගින් මග පෙන්වීම, අණපනත් සංශෝධනයට කටයුතු කිරිම, අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ චක්‍රලේක උපදෙස් පළාත් පාලන ආයතනවලට දැණුම්දීම, නිති කටයුතු සම්බන්ධීකරණය හා පවත්වාගෙන යාම, පළාත් පාලනය විෂය සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරවරයා, ගරු අමාත්‍යවරයා සඳහා පැවරී ඇති කාර්යභාරය ඉටු කිරිම සඳහා සම්බන්ධ වීම, දකුණු පළාත් බල ප්‍රදේශය තුළ වූ පළාත් පාලන ආයතන වල කටයුතු අධීක්ෂණය කිරීම, පළාත් පාලන ආයතනවල සියළු නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම, දකුණු පළාතේ මහජනතාවගේ පෙත්සම් පැමිණිලි සම්බන්ධ අවශ්‍ය පරීක්ෂණ කර අවශ්‍ය කටයුතු කිරීම, පළාත් පාලන ආයතනවල වංචා හා දූෂණ කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම , කාර්යාල පරීක්ෂණ , කණ්ඩායම් පරීක්ෂණ කර පළාත් පාලන ආයතනවලට උපදෙස් දීම වැනි කටයුතු සිදු වේ.

පළාත් පාලන දෙපාර්තමේන්තුව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල 03කින්ද, මහ නගර සභා 03කින්ද, නගර සභා 04 කින්ද, ප්‍රාදේශීය සභා 42කින්ද සමන්විත පරිපාලන ව්‍යුහයකින් සකස් වී ඇත.

| මහ නගර සභා / නගර සභා / ප්‍රාදේශීය සභාවේ නම | වර්ග ප්‍රමාණය (වර්ග කි.මී.) | ජනගහනය | මහජන නියෝජිතයින් සංඛ්‍යාව |
|---|---|---|---|
| ගාල්ල මහා නගර සභාව | 16.5 | 114564 | 35 |
| අම්බන්ගොඩ නගර සභාව | 7.12 | 23776 | 21 |
| හික්කඩුව නගර සභාව | 12.83 | 29147 | 20 |
| අක්මීමණ ප්‍රාදේශිය සභාව | 63 | 89713 | 28 |
| අම්බලන්ගොඩ ප්‍රාදේශිය ස. | 64 | 62558 | 12 |
| බද්දේගම ප්‍රාදේශිය සභාව | 112.8 | 82803 | 34 |
| බලපිටිය ප්‍රාදේශිය සභාව | 64 | 77436 | 34 |
| බෙන්තොට ප්‍රාදේශිය සභාව | 74.5 | 53682 | 24 |
| බෝපේ පෝද්දල ප්‍රාදේශිය ස. | 40.72 | 69871 | 22 |
| ඇල්පිටිය ප්‍රාදේශිය සභාව | 133.12 | 67080 | 29 |
| හබරාදූව ප්‍රාදේශිය සභාව | 44.01 | 67340 | 27 |
| ඉමදූව ප්‍රාදේශිය සභාව | 59.5 | 50792 | 17 |
| කරන්දෙණිය ප්‍රාදේශිය සභාව | 84 | 68797 | 20 |
| නාගොඩ ප්‍රාදේශිය සභාව | 177 | 63796 | 27 |
| නෙළුව ප්‍රාදේශිය සභාව | 153.4 | 29648 | 17 |
| නියාගම ප්‍රාදේශිය සභාව | 110 | 41810 | 17 |
| රජ්ගම ප්‍රාදේශිය සභාව | 49.32 | 84014 | 30 |
| තවලම ප්‍රාදේශිය සභාව | 188.8 | 33457 | 18 |
| වැලිවිටිය දිවිතුර ප්‍රාස | 55.09 | 32210 | 16 |
| යක්කලමුල්ල ප්‍රාදේශිය ස | 111.46 | 51489 | 21 |
| මාතර මහා නගර සභාව | 12.8 | 73373 | 30 |
| වැලිගම නගර සභාව | 6.65 | 24583 | 18 |

| | | | |
|---|---|---|---|
| අකුරැස්ස ප්‍රාදේශිය සභාව | 145 | 54923 | 25 |
| අතුරලිය ප්‍රාදේශිය සභාව | 63 | 34497 | 17 |
| දෙවිනුවර ප්‍රාදේශිය සභාව | 39.9 | 53979 | 21 |
| දික්වැල්ල ප්‍රාදේශිය සභාව | 51.2 | 57340 | 27 |
| හක්මණ ප්‍රාදේශිය සභාව | 47.7 | 34356 | 17 |
| කඹුරුපිටිය ප්‍රාදේශිය සභාව | 60.86 | 46022 | 17 |
| කිරින්ද පුහුල්වැල්ල ප්‍රාස | 38 | 22285 | 11 |
| කොටපොළ ප්‍රාදේශිය සභාව | 175.5 | 70928 | 24 |
| මාලිම්බඩ ප්‍රාදේශිය සභාව | 36.32 | 39174 | 17 |
| මාතර ප්‍රාදේශිය සභාව | 41.1 | 115770 | 31 |
| මුලටියන ප්‍රාදේශිය සභාව | 114 | 56632 | 22 |
| පස්ගොඩ ප්‍රාදේශිය සභාව | 149.71 | 61947 | 27 |
| පිටබැද්දර ප්‍රාදේශිය සභාව | 141.6 | 56345 | 21 |
| තිහගොඩ ප්‍රාදේශිය සභාව | 45.2 | 36577 | 17 |

| | | | |
|---|---|---|---|
| වැලිගම ප්‍රාදේශිය සභාව | 101.4 | 104068 | 41 |
| හම්බන්තොට මහා නගර ස. | 79.61 | 28376 | 21 |
| තංගල්ල නගර සභාව | 1.6 | 8586 | 18 |
| අම්බලන්තොට ප්‍රාදේශිය ස. | 213.4 | 86181 | 32 |
| අඟුණකොළපැලැස්ස ප්‍රාස | 173.06 | 57730 | 20 |
| බෙලිඅත්ත ප්‍රාදේශිය සභාව | 105 | 62377 | 29 |
| හම්බන්තොට ප්‍රාදේශිය සභාව | 245.05 | 38138 | 14 |
| කටුවන ප්‍රාදේශිය සභාව | 169 | 78092 | 30 |
| ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ස. | 247 | 35779 | 16 |
| සූරියවැව ප්‍රාදේශිය සභාව | 167 | 55071 | 11 |
| තංගල්ල ප්‍රාදේශිය සභාව | 152.429 | 70645 | 29 |
| තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව | 842 | 85106 | 23 |
| වීරකැටිය ප්‍රාදේශිය සභාව | 205.56 | 92930 | 36 |
| **එකතුව** | **5491.819** | **2835793** | **1131** |

## 3.2 **Staff** කාර්ය මණ්ඩලය

පළාත් පාලන දෙපාර්තමේන්තුව සතු සේවක සංඛ්‍යාව ගාල්ල , මාතර , හම්බන්තොට දිස්ත්‍රික්ක අනුව පහත පරිදි දැක්විය හැක.

| පළාත් පාලන ආයතනය | විධායක | මාණ්ඩලික | ප්‍රජා සං. නිල | සැල සුම් ශිල්පී | සංවර්ධන නිලධාරී | කළමනාකරණ සහකාර | රියදුරු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | 11 | 5 | 38 | 4 | 48 | 23 | 8 | 54 | **191** |
| ගාල්ල මහා නගර සභාව | 10 | 5 | 1 | 1 | 15 | 78 | 41 | 559 | **710** |
| අම්බලන්ගොඩ නගර සභාව | 2 | 2 | 0 | 0 | 8 | 21 | 4 | 75 | **112** |
| හික්කඩුව නගර සභාව | 4 | 1 | 0 | 0 | 9 | 12 | 9 | 72 | **107** |
| බළපිටිය ප්‍රාදේශිය සභාව | 3 | 1 | 0 | 0 | 9 | 15 | 6 | 86 | **120** |
| බෙන්තොට ප්‍රාදේශිය සභාව | 2 | 2 | 0 | 0 | 10 | 10 | 5 | 64 | **93** |
| බෝපෙ පෝද්දල ප්‍රාදේශිය සභාව | 2 | 1 | 1 | 0 | 9 | 9 | 8 | 45 | **75** |
| හබරාදූව ප්‍රාදේශිය සභාව | 2 | 1 | 0 | 0 | 11 | 10 | 8 | 95 | **127** |
| ඉමදූව ප්‍රාදේශිය සභාව | 2 | 0 | 0 | 0 | 7 | 6 | 5 | 46 | **66** |
| කරන්දෙණිය ප්‍රාදේශිය සභාව | 2 | 1 | 1 | 0 | 6 | 8 | 3 | 33 | **54** |
| නාගොඩ ප්‍රාදේශිය සභාව | 1 | 1 | 0 | 0 | 6 | 6 | 3 | 43 | **60** |
| නෙළුව ප්‍රාදේශිය සභාව | 1 | 1 | 0 | 0 | 7 | 6 | 2 | 24 | **41** |
| නියාගම ප්‍රාදේශිය සභාව | 0 | 2 | 0 | 0 | 5 | 8 | 3 | 39 | **57** |
| රත්ගම ප්‍රාදේශිය සභාව | 2 | 2 | 0 | 0 | 8 | 9 | 10 | 70 | **101** |
| තවලම ප්‍රාදේශිය සභාව | 1 | 0 | 0 | 0 | 7 | 7 | 2 | 27 | **44** |
| අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව | 2 | 1 | 1 | 0 | 8 | 7 | 3 | 36 | **58** |
| අක්මීමණ ප්‍රාදේශිය සභාව | 2 | 1 | 0 | 0 | 9 | 5 | 8 | 62 | **87** |
| වැලිවිටිය දිවිතුර ප්‍රාදේශිය සභාව | 1 | 1 | 0 | 0 | 5 | 6 | 1 | 24 | **38** |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව | 1 | 1 | 1 | 0 | 10 | 3 | 3 | 47 | **66** |
| බද්දේගම ප්‍රාදේශීය සභාව | 2 | 1 | 0 | 0 | 7 | 9 | 5 | 50 | **74** |
| ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | 3 | 1 | 0 | 0 | 7 | 10 | 4 | 67 | **92** |
| | | | | | | | | | |
| මාතර මහා නගර සභාව | 5 | 3 | 0 | 1 | 3 | 44 | 41 | 46 | **143** |
| වැලිගම නගර සභාව | 2 | 1 | 1 | 0 | 12 | 21 | 8 | 125 | **170** |
| අතුරලිය ප්‍රාදේශීය සභාව | 1 | 1 | 1 | 0 | 10 | 5 | 3 | 22 | **43** |
| කොටපොළ ප්‍රාදේශීය සභාව | 1 | 1 | 0 | 0 | 5 | 7 | 5 | 47 | **66** |
| මාලිම්බඩ ප්‍රාදේශීය සභාව | 0 | 1 | 1 | 0 | 10 | 7 | 1 | 19 | **39** |
| හක්මණ ප්‍රාදේශීය සභාව | 0 | 1 | 1 | 0 | 15 | 8 | 6 | 47 | **78** |
| තිහගොඩ ප්‍රාදේශීය සභාව | 1 | 1 | 0 | 0 | 12 | 7 | 3 | 27 | **51** |
| පස්ගොඩ ප්‍රාදේශීය සභාව | 2 | 0 | 0 | 0 | 9 | 5 | 2 | 31 | **49** |
| පිටබැද්දර ප්‍රාදේශීය සභාව | 1 | 1 | 0 | 0 | 7 | 7 | 4 | 43 | **63** |
| කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 11 | 6 | 3 | 36 | **57** |
| මුලටියන ප්‍රාදේශීය සභාව | 1 | 1 | 1 | 0 | 12 | 8 | 4 | 27 | **54** |
| දෙවිනුවර ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 15 | 9 | 9 | 46 | **80** |
| කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව | 0 | 1 | 1 | 0 | 15 | 6 | 3 | 56 | **82** |
| මාතර ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 14 | 10 | 7 | 62 | **94** |
| දික්වැල්ල ප්‍රාදේශීය සභාව | 2 | 1 | 1 | 0 | 10 | 10 | 1 | 45 | **70** |
| අකුරැස්ස ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 11 | 13 | 5 | 44 | **74** |
| වැලිගම ප්‍රාදේශීය සභාව | 1 | 1 | 0 | 0 | 9 | 8 | 7 | 80 | **106** |
| | | | | | | | | | |
| හම්බන්තොට මහා නගර සභාව | 1 | 1 | 0 | 0 | 3 | 17 | 12 | 120 | **154** |
| තංගල්ල නගර සභාව | 0 | 1 | 1 | 0 | 10 | 13 | 9 | 87 | **121** |
| ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 4 | 4 | 4 | 24 | **37** |
| තංගල්ල ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 10 | 6 | 5 | 64 | **86** |
| හම්බන්තොට ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 6 | 4 | 3 | 32 | **46** |
| සූරියවැව ප්‍රාදේශීය සභාව | 0 | 1 | 0 | 0 | 4 | 6 | 7 | 43 | **61** |
| වීරකැටිය ප්‍රාදේශීය සභාව | 0 | 1 | 1 | 0 | 11 | 8 | 5 | 56 | **82** |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| අඟුණකොළපැලැස්ස ප්‍රාදේශිය සභාව | 0 | 1 | 0 | 0 | 12 | 4 | 5 | 40 | **62** |
| බෙලිඅත්ත ප්‍රාදේශිය සභාව | 0 | 1 | 0 | 0 | 14 | 7 | 6 | 71 | **99** |
| තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව | 1 | 2 | 1 | 0 | 3 | 10 | 8 | 78 | **103** |
| කටුවන ප්‍රාදේශිය සභාව | 2 | 1 | 0 | 0 | 12 | 11 | 11 | 74 | **111** |
| අම්බලන්තොට ප්‍රාදේශිය සභාව | 1 | 1 | 1 | 0 | 8 | 12 | 7 | 87 | **117** |
| එකතුව | **78** | **62** | **54** | **6** | **488** | **551** | **335** | **3197** | **4771** |

මෙහිදී මෙම  දෙපාර්තමේන්තුව පළාත් පාලන කොමසාරිස් , නියොජ්‍ය පළාත් පාලන කොමසාරිස් සහ සහකාර පළාත් පාලන කොමසාරිස්වරු තිදෙනෙකුගෙන් යුක්තව පාලනය වීමක් සිදු වේ.

## 3.3 **Other Assets**

### **වෙනත් වත්කම්**

- දේශීය සහ විදේශීය වශයෙන් විවිධ පුහුණුවීම් සඳහා යොමු වූ විධායක සහ මාණ්ඩලික  නිලධාරීන් මණ්ඩලයක්  සිටීම.
- විවිධ විෂයන් යටතේ ලබා ගත් පශ්චාත් උපාධි, උපාධි, ඩිප්ලෝමා හදාරනු ලැබූ නිලධාරීන් පිරිසක් සිටීම.
- සංවර්ධන සැපසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි , පළාත් පාලන විෂය සම්භන්ධ ඩිප්ලෝමා ලද නිලධාරීන් පිරිසක් සිටීම.
- විශේෂිත හැකියාවන් සහිත වූ නිලධාරීන් සිටීම.

## Fixed Assets
## ස්ථාවර වත්කම්

- දෙපාර්තමේන්තුව සහ සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලවල පවතින ස්ථාවර වත්කම්

දෙපාර්තමේන්තු කොමසාරිස්ට අයත් නිලරථය සහ දෙපාර්තමේන්තුව හා සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලවලට අයත් වාහන, යන්ත්‍රෝපකරණ ආදිය මේ යටතට ගත හැක.

දකුණු පළාතේ මහජනතාවට කඩිනම් සේවාවක් ලබා දීමේ අරමුණින් දෙපාර්තමේන්තුව සහ සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලවල පහසුකම් වැඩි දියුණු කරමින් සියළු පළාත් පාලන ආයතනවලට පරිඝනක යන්ත්‍ර ලබා දීම ,කාර්යාලීය උපකරණ ලබා දීම සිදු කර ඇත. එමෙන්ම වායුසමීකරණ, ස්කෑනින් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර ඡායා පිටපත් යන්ත්‍ර, කැමරා සහ අවශ්‍ය උපකරණ ආයතනය සතුව පවතී. මෙහිදී පළාත් පාලන සම්පත් මධ්‍යස්ථානය, මොන්රෝවියාවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පවතින ස්ථාවර වත්කම් ඇතුලත් වේ. මෙහි සමස්ථ වටිනාකම් පහත ලෙස දැක්විය හැක.

| ස්ථාවර වත්කම් | වටිනාකම |
|---|---|
| ඉදිකිරීම් | 7,057,445.85 |
| කාර්යාලීය උපකරණ | 32,423,518.24 |
| යන්ත්‍රසූත්‍ර | 29,599,092.97 |
| මුළු වටිනාකම | 69,080,057.06 |

මෙයට අමතරව පළාත් පාලන ආයතන සතු ස්ථාවර වත්කම්, පෙර පාසල්, ආයුර්වේද බෙහෙත් ශාලා, පුස්තකාල, ප්‍රජා ශාලා, සති පොළ, ආදාහනාගාර,සුසානභූමි, පොදුලිං, ක්‍රීඩා පිටි ආදී වත්කම් දැක්විය හැක.(ඇමුණුම් 03 යටතේ සංඛ්‍යාත්මකව දැක්වේ)

## Current Assets
## ජංගම වත්කම්

දෙපාර්තමේන්තුව සතුව පවතින අතැති මුදල් සහ බැංකු ශේෂයන් වේ.

අන්තර්ජාල කටයුතු සඳහා යොදා ගන්නා දත්ත පහසුකම්.

# CHAPTER 4

# EXTERNAL ENVIRONMENT ANALYSIS

## බාහිර පාරිසරික විශ්ලේෂණය

## 4.1 **Political Environment**

### **දේශපාලනික පරිසරය**

දකුණු පළාත් සභාව තුල ශක්තිමත් දේශපාලන පද්ධතියක් පවතී.නව ව්‍යපෘති සදහා ජාතික දේශපාලන නායකයන්ගෙන් ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාවත්, කොට්ඨාශ ක්‍රමය තුල ගැටළු හදුනා ගැනීමේ පහසුවක් පැවතීමත් මෙහිදී වැදගත් වේ.නමුත් සභාව තුල තම අභිමතයන්ට අනුව කටයුතු කිරීම් මත සාධාරණ මග පෙන්වීම් නොමැති කම සහ දේශපාලන අභිමතයන් පරිදි කටයුතු සිදු කිරීම මත ජාතික සම්පත් විශාල වශයෙන් නාස්ති වීම් සිදු වේ.මෙහිදී දේශපාලන අධිකාරියන්හි මගපෙන්වීම් සාධාරණ නොවීමත්, දේශපාලන පක්ෂ වල එකගතාවයන් නොමැතිකමත්, දේශපාලන ප්‍රතිපත්ති වල විචලනයන් සිදු වීමත්, පළාත් පාලන විෂය හදුනා නොගත් පුද්ගලයින් තනතුරු සදහා පත් වීමත් මගින් විවිධ බලපෑම් සිදු විමක් දැකිය හැක.මැතිවරණ ක්‍රියාවලිය තුල පවතින දේශපාලන විචලතාවයන් සදහා තීරණයට ලක් වීම, පළාත් සභාව හා පළාත් පාලනය අතර තුලනයක් පවත්වාගෙන යාමේ අපහසුතාවය නිසා ඇති වන බලපෑම.

## 4.2 **Economic Environment**

### **ආර්ථික පරිසරය**

දකුණු පළාත තුල දියුණු වාණිජ නගරවල පිහිටීම මෙන්ම ශක්තිමත් රාජ්‍ය, පෞද්ගලික හා මූල්‍ය අංශ අංශ පැවතීම ආර්ථික වශයෙන් ඉතා වැදගත් වේ. කෘෂිකාර්මික ,ධිවර, සංචාරක, පෞද්ගලික විවිධ කර්මාන්ත අංශයන්ගෙන් ආර්ථිකය පෝෂණය වේ. දියුණු මාර්ග පද්ධතීන්ගෙන් සහ මනා යටිතල පහසුකම්වලින් යුක්ත වීමත්, අධිවේගී මාර්ග පිවිසුම් පැවතීමත් ආර්ථිකමය ශක්තිමත්භාවයට ඉතා වැදගත් වේ. කෘෂිකර්මාන්ත, ධීවර කර්මාන්ත, කුඩා කර්මාන්ත නගා සිටුවීමට අවස්ථාව පැවතීම ,සංචාරක ආකර්ශන වලින් බහුල සංචාරක ව්‍යාපාරය දියුණු කළ හැකි ප්‍රදේශයක පිහිටීම, කෘෂිකර්මාන්ත, ධීවර කර්මාන්ත, කුඩා කර්මාන්ත නගා සිටුවීමට අවස්ථාව පැවතීම ආර්ථික වශයෙන් තව දුරටත් ශක්තිමත් විය හැකි අවස්ථාවකි.

සෞභාග්‍යයේ දැක්මේ සිවු මහා නගර යටතට ගැනෙන හම්බන්තොට නගරයද, ජාතික නගර 9 න් එකක් වන ගාල්ල නගරයද , සහසම්බන්ධිත නගර අතරින් එකක් වන මාතර නගරයද මගින් දකුණු පළාතේ දිස්ත්‍රික්ක තුනම නියෝජනය වනු ඇත. එමෙන්ම ප්‍රධාන වරායන් මෙන්ම ගුවන්තොටුපළවල් ගාල්ල සහ හම්බන්තොට නගරයන්හි පිහිටීමත් ශක්තිමත් ආර්ථික පරිසරයකට මනා පිටුවහලකි.

## 4.3 Socio-Cultural Environment

### සමාජ සංස්කෘතික පරිසරය

ජාතිය , කුලය හා ආගම යන තීරණාත්මක සාධක සමාජ හා සංස්කෘතික පරිසරය තුල දැඩි ලෙස බලපෑම් සිදු කරණු ලබයි. විවිධ ආගම්, විවිධ ජාතීන් , විවිධ කුල සහ විවිධ සංස්කෘතීන්ගෙන් යුක්ත වූවන් දකුණු පළාත තුල බහුලව ජීවත් වේ. මෙම විවිධත්වයන් බහුලව නාගරික ප්‍රදේශවල ජීවත්වන ජනයා අතර දැකිය හැක. ජනතාවගෙන් බහුතරයක් බෞද්ධාගමිකයන් වේ. තරගකාරී අධ්‍යාපන රටාවත්, උසස් අධ්‍යාපනය ලත් විවිධ කුසලතාවයන්ගෙන් යුත් ප්‍රජාවක් සිටීමත් මේ අතර වැදගත් වේ. තරගකාරී අධ්‍යාපන රටාව නිසා සිසුන් ආගමික කටයුතු වලින් ඈත් වීමක් සිදු වේ.ප්‍රදේශය පුරා මත්ද්‍රව්‍ය උවදුර ව්‍යප්ත වීමත් තරුණ කොටස් මත්ද්‍රා සඳහා ඇබ්බැහිවීමත් දක්නට ලැබේ.
අධ්‍යාපන දර්ශක වලින් ඉහලම කාර්යසාධනය,

## 4.4 Technological Environment

### තාක්ෂණ පරිසරය

තාක්ෂණික ඥානය පුළුල්ව භාවිතා කළ හැකි බුද්ධිමත් මානව සම්පතක් පැවතීම මෙහිදී ඉතාමත් වැදගත් සාධකයකි. මෙහිදී නවීන තාක්ෂණික උපකරණ වල අවශ්‍යතාවයක් පවතී. නමුත් තාක්ෂණය භාවිතය පිළිබඳ ජනතාවගේ දැනුම තවදුරටත් පුළුල් විය යුතුය.තාක්ෂණික ඥානය විධිමත්ව යොදා නොගැනීම සහ අවභාවිතය සිදු වීම, සේවා සැපයීමේදී නවීන තාක්ෂණික උපකරණ යොදා නොගැනීම, පරිගණක දත්ත පද්ධතිවල පවතින දුර්වලතා මගින් විවිධ බාධා ඇති වේ. සමාජ ජාලා හරහා නිරන්තරයෙන්ම බහුතර පිරිස් යෙදී සිටීම සහ සෑම අවස්ථාවලදීම සත්‍ය පුවත් සමාජගත නොවීම සිදු වේ.සංවර්ධන කටයුතු සඳහා තාක්ෂණික දැණුම පුළුල්ව යොදා ගත යුතුව පවතී.

## 4.5 Ecological Environment

### පාරිසරික විද්‍යාත්මක පරිසරය

දකුණු පළාත සොබා සෞන්දර්යයෙන් සහ සංචාරක ආකර්ෂන වලින් බහුල කලාපයකි. වෙරළාසන්නව නගර වල පිහිටීම , වෙරළ ඛාදනයට ලක් වීම , වෙරළ දූෂණ කටයුතු සිදු වීම මත වෙරළ සංරක්ෂණ කටයුතු සිදු වීම මෙම කලාපය තුල දැකිය හැක.කසළ කළමනාකරණය පිළිබඳව ප්‍රජාවේ නොදැනුවත් බව සහ කසළ බැහැර කිරීමේ ගැටළු පැවතීම, පහත් බිම් ගොඩ කිරීම සහ අවිධිමත් ඉදිකිරීම් සිදු වීම,මැසි මදුරු උවදුරු, ඩෙංගු ආදී සෞඛ්‍ය ගැටළු පැන නැගීම, ගංවතුර, සුනාමි, වැනි හදිසි ආපදා තත්වයන් ඇතිවීම මත විවිධ පාරිසරික ගැටළු පැන නැගී ඇත.

## 4.6Legal Environment

### නීතිමය පරිසරය

පළාත් පාලන ආයතන සංස්ථාපනය කර ඇති මූලික නීතීයන් වන්නා වූ 252 අධිකාරිය වන 1947 අංක 29 දරණ මහා නගර සභා ආඥා පනත, 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත් මගින් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත බලය ලැබී ඇත. පළාත් පාලන ආයතන වල බලතල, කාර්යය හා කර්තව්‍ය නිශ්චය කර ඇති පහත ආඥාපනත් සහ පනත් ප්‍රධාන වේ.

- ගෝගාතක අඥාපනත
- 1952 අංක 06 දරණ ප්‍රාදේශිය බලමණ්ඩල(පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබද ආඥාපනත
- ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත
- පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබද ආඥාපනත
- 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත
- 1987 අංක 42 දරන පළාත් සභා පනත
- 1946 අංක 30 දරණ තක්සේරුකරණ ආඥාපනත
- නිවාස හා නගර සංවර්ධන ආඥාපනත
- නාගරික සංවර්ධන අධිකාරී පනත
- 1987 අංක 47 දරණ ජාතික පාරිසරික පනත
- පීඩන ක්‍රියා ආඥාපනත
- බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත
- ජලභීතාකා රෝග ආඥාපනත
- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබද පනත
- ජාතික විගණන පනත
- අධිකරණ සංවිධාන පනත
- ළිං සහ වළවල් පිළිබද ආඥාපනත

- 1952 අංක 06 දරණ ප්‍රාදේශීය බලමණ්ඩල (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පිළිබඳ ආඥාපනත

මෙයට අමතරව ප්‍රඥාප්ති ලෙස ,

- 1980 අංක 04 දරණ දකුණු පළාතේ පළාත් පාලන ආයතන වල පරිපාලනය අධික්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥාප්තිය
- 1994 අංක 04 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥාප්තිය
- 2008 අංක 02 දරණ දකුණු පළාත් පෙර පාසල් ප්‍රඥාප්තිය

මෙහිදී ජනතාව නීතිය පිළිබඳ දැනුවත්භාවය අවම වීම, තම අයිතිවාසිකම් පිළිබඳ පැහැදිළි අවබෝධයක් නොමැතිකම මගින් නෛතික ගැටළු රාශියක් පැන නැගී ඇත. පළාත් පාලන කටයුතුවලදී අණපනත්වල පවතින යම් යම් කරුණු යාවත්කාලීන විය යුතුය. අවශ්‍ය නීති සම්පාදකයන්ගේ දුර්වලතා පැවතීමත්, දේශපාලන අධිකාරීන් විසින් නීතිය නොතකා කටයුතු කිරීමට බලපෑම් කිරීම සිදු කිරීමත් මගින් විවිධ ගැටළුකාරී තත්වයන් පැන නැගී ඇත.

# CHAPTER 5

# PERFORMANCE REVIEW OF PAST THREE YEARS

## පසුගිය තෙවසරක කාර්යසාධන ඇගයීම

## 5.1 **Current State**

## 5.1 **වත්මන් තත්වය**

2017, 2018, 2019 වර්ෂවල දී සිදු කරන ලද සංවර්ධන හා අනෙකුත් ව්‍යාපෘති මගින් දෙපාර්තමේන්තුමය වශයෙන් හා පළාත් පාලන ආයතන වශයෙන් යහපත් මට්ටමේ ප්‍රතිඵල ලබා ඇත. මෙමගින් සපයනු ලබන සේවාවල ගුණාත්මකභාවය ඉහළ යාම විශේෂයෙන් වැදගත් වේ. දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලය ඉහළ තෘප්තිමත් භාවයකින් රාජකාරී කටයුතු සිදු කිරීමත් , අදාල වර්ෂ වල සේවාලාභී පැමිණිලි හා දුක්ගැනවිලි අඩුවීමත් , ජාතික මට්ටමින් පළාත් පාලන ආයතන ඉහළ ජයග්‍රහණ ලබා තිබීමත් සතුටුදායක මට්ටමක පවතී.(ඇමුණුම් අංක 01 ) දකුණු පළාතේ මහජනතාවට කඩිනම් සේවාවක් ලබා දීමේ අරමුණින් පළාත් පාලන ආයතනවල පහසුකම් වැඩි දියුණු කර ඇත. මෙහිදී සියළු පළාත් පාලන ආයතන වලට පරිඝනක යන්ත්‍ර ලබා දීම , පළාත් පාලන ආයතන සඳහා යන්ත්‍රෝපකරණ ලබා දීම , අවශ්‍ය කාර්යමණ්ඩලය සම්පාදනය කර ගැනීමට සහයෝගය ලබා දීම විශේෂ වේ.

පළාතේ ජනතාවට ගුණාත්මක සේවයක් ලබා දීම සඳහා මනා අභිප්‍රේරණය වූ සේවක පිරිසක් නිර්මාණය කිරීමේ අරමුණින් විවිධ වැඩසටහන් සිදු කර ඇත. මෙහිදී දේශීය හා විදේශීය අධ්‍යාපන චාරිකා , කාර්ය සාධන තරග , සේවක ඇගයීම් , පුහුණු වැඩසටහන් තුලින් ආයතනික මානව සම්පත සංවර්ධනය කර ඇත. (ඇමුණුම් අංක 02 )

විවිධ ව්‍යාපෘතීන්හි මාසික ප්‍රගතිය පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සෑම මසකම සහකාර කොමසාරිස් දෙපාර්තමේන්තු මගින් ගෙන්වා ඒ පිළිබඳ සාකච්ඡා පවත්වනු ලබයි. සංවර්ධන ව්‍යාපෘති මගින් පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සිදුකර ඇත.පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, උපමාන පාදක සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතීන් මෙහිදී ඉතා වැදගත් වේ. මේ අතර නව පාරවල් ඉදි කිරිම හා නඩත්තු කිරීම, සනීපාරක්ෂක ජල සැපයුම, ආදාහනාගාර හා සුසාන භූමි සංවර්ධනය , පුස්තකාල පහසුකම් සැපයීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය , පූර්ව ළමා විය සංවර්ධනය , පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධනය, සතිපොළ සංවර්ධනය , පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධනය , පළාත් පාලන වෙනත් සේවා මගින් දියුණු ප්‍රාදේශීය වර්ධනයක් දැකිය හැක. මේ සඳහා ප්‍රතිපාදන යොදවා ඇති ආකාරය පසුව විස්තර වේ.

## වර්තමානයේදී පළාත් පාලන ආයතනය මගින් සිදු කරණු ලබන සුවිශේෂී කාර්යභාරයන්

- දකුණු පළාත තුල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන මනාව නඩත්තු කිරීම.

- නව පාරවල් , පැති කාණු සහ පැති බැමි ඉදි කිරීම සහ නඩත්තුව.

- දකුණු පළාත තුල පවතින සංචාරක ආකර්ශන ස්ථාන පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

- ආදාහනාගාර සහ සුසානභූමි ඉදිකිරීම සහ සංවර්ධනය.

- සතිපොළ සහ වෙළඳපොළ ස්ථාන ඉදිකිරීම සහ නඩත්තුව.

- පුස්තකාල සහ පෙර පාසල් පහසුකම් සැපයීම.

- ආර්යුවේද පහසුකම් සැපයීම.

- මහජන ක්‍රීඩාංගන පහසුකම් සැපයීම.

- දිවා සුරකුම් මධ්‍යස්ථාන සහ වැඩිහිටි නිවාස සංවර්ධනය.

## 5.2 **Operational Review**


### මෙහෙයුම් ඇගයීම

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදන සංවර්ධන ප්‍රදාන යන්නා වූ ප්‍රතිපාදන ප්‍රභවයන්හි පසුගිය වසර ත්‍රිත්වය පුරා සිදු කරන ලද මෙහෙයුම් කටයුතු මෙසේය.**

**පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පසුගිය තෙවසර තුල පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ වෙන්කළ ප්‍රතිපාදන සහ සිදු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව**


| | අංශය | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන(PSDG) | | | | | | උපමාන පාදක සංවර්ධන ප්‍රදාන(CBG) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2017 | | 2018 | | 2019 | | 2017 | | 2018 | | 2019 | |
| | | වෙන් කල ප්‍රතිපාදන | ව්‍ය පෘති සං ඛ්‍යා ව | වෙන් කල ප්‍රතිපාදන | ව්‍ය පෘති සං ඛ්‍යා ව | වෙන් කල ප්‍රතිපාදන | ව්‍ය පෘ ති සං ඛ්‍යා ව | වෙන් කල ප්‍රතිපාදන | ව්‍ය පෘ ති සං ඛ්‍යා ව | වෙන් කල ප්‍රතිපාදන | ව්‍ය පෘ ති සං ඛ්‍යා ව | වෙන් කල ප්‍රතිපාදන | ව්‍ය පෘ ති සං ඛ්‍යා ව |
| 1 | පළාත් පාලන මාර්ග | 49923642 | 63 | 55103460 | 52 | 24346659 | 37 | 40795310 | 31 | 2900000 | 5 | 38040000 | 43 |
| 2 | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | 29000000 | 21 | 29000000 | 15 | 16940000 | 11 | – | – | – | – | – | – |
| 3 | ප්‍රජා ජල සම්පාදනය | 33000000 | 58 | 25724665 | 34 | 11500000 | 16 | – | – | – | – | – | – |
| 4 | පළාත් පාලන වෙනත් සේවා | 13000000 | 23 | 14000000 | 15 | 51788712 | 24 | 13540000 | 7 | 9500000 | 12 | 4450000 | 4 |
| 5 | ආදාහනාගාර සංවර්ධනය | – | – | – | – | – | – | 18750000 | 12 | 17000000 | 13 | 14300000 | 12 |
| 6 | සති පොළ සංවර්ධනය | – | – | – | – | – | – | 13420000 | 13 | 14000000 | 13 | 8200000 | 9 |
| | එකතුව | 124923642 | 165 | 123828125 | 116 | 104575372 | 88 | 86505310 | 63 | 43400000 | 43 | 64990000 | 68 |

## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ සිදු කළ ව්‍යාපෘති සංඛ්‍යාව




| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| PSDG-පළාත් පාලන මාර්ග | 63 | 52 | 37 |
| PSDG-ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | 21 | 15 | 11 |
| PSDG-ප්‍රජා ජල සම්පාදනය | 58 | 34 | 16 |
| PSDG-පළාත් පාලන වෙනත් සේවා | 23 | 15 | 24 |
| CBG-පළාත් පාලන මාර්ග | 31 | 5 | 43 |
| CBG-පළාත් පාලන වෙනත් සේවා | 7 | 12 | 4 |
| CBG-ආදාහනාගාර සංවර්ධනය | 12 | 13 | 12 |
| CBG-සති පොළ සංවර්ධනය | 13 | 13 | 9 |


## පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කළ ප්‍රතිපාදන





| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| PSDG-පළාත් පාලන මාර්ග | 49.00 | 55.10 | 24.34 |
| PSDG-සණ අපද්‍රව්‍ය කළමනාකරණය | 29.00 | 29.00 | 16.94 |
| PSDG-ප්‍රජා ජල සම්පාදනය | 33.00 | 25.72 | 11.50 |
| PSDG-පළාත් පාලන වෙනත් සේවා | 13.00 | 14.00 | 51.79 |
| CBG-පළාත් පාලන මාර්ග | 40.79 | 2.90 | 38.00 |
| CBG-පළාත් පාලන වෙනත් සේවා | 13.54 | 9.50 | 4.45 |
| CBG-ආදාහනාගාර සංවර්ධනය | 18.75 | 17.00 | 14.30 |
| CBG-සති පොළ සංවර්ධනය | 13.42 | 14.00 | 8.20 |

**පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පසුගිය තෙවසර තුල මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වෙන් කළ ප්‍රතිපාදන සහ ව්‍යාපෘති සංඛ්‍යාව**

| | අංශය | නිදහස් කල ප්‍රතිපාදන | | | ව්‍යාපෘති සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 | 2017 | 2018 | 2019 |
| 1 | ගාල්ල | 9,125,153.00 | 6,927,765.16 | 8,285,400.00 | 117 | 101 | 60 |
| 2 | මාතර | 8,878,639.04 | 8,765,000.00 | 6,035,000.00 | 96 | 127 | 64 |
| 3 | හම්බන්තොට | 7,719,180.00 | 6,665,000.00 | 5,375,000.00 | 62 | 79 | 50 |
| | **එකතුව** | **25,722,972.04** | **22,357,765.16** | **19,695,400.00** | **275** | **307** | **174** |





| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| ගාල්ල | 9.12 | 6.93 | 8.29 |
| මාතර | 8.88 | 8.77 | 6.67 |
| හම්බන්තොට | 8.29 | 6.03 | 5.38 |




| | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| ගාල්ල | 117 | 101 | 60 |
| මාතර | 96 | 127 | 64 |
| හම්බන්තොට | 62 | 79 | 50 |

## පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති


| | වැඩසටහන | වෙන් වූ ප්‍රතිපාදන | | | ව්‍යාපෘති සංඛ්‍යාව | | | වියදම | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2019 | 2017 | 2018 | 2019 | 2017 | 2018 | 2019 |
| 1 | ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී. 1000 සංවර්ධනය කිරීමේ වැඩසටහන | 34,749,937 | 2,805,631 | 16,548,520 | 32 | 2 | 27 | 31,519,438 | 2,623,238 | 15,563,779 |
| 2 | යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන | 17,032,890 | 7,551,659 | | 18 | 3 | | 14,868,305 | 6,007,844 | |
| 3 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ (ප්‍රාග්ධන)වැඩසටහන -2019 | | | 7,053,042 | | | 11 | | | 6,786,917 |
| 4 | ප්‍රාදේශීයසභා ශක්තිමත් කිරීමේ (පුනරාවර්තන) වැඩසටහන - 2019 | 62,664,340 | | 62,080,303 | 40 | | 91 | 52,817,540 | | 56,632,124 |
| | එකතුව | 114,447,168 | 10,357,290 | 85,681,866 | 90 | 5 | 129 | 99,205,284 | 8,631,082 | 78,982,821 |



පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති
70,000,000.00
60,000,000.00
50,000,000.00
40,000,000.00
30,000,000.00
20,000,000.00
10,000,000.00
-
ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග කි.මී.1000 සංවර්ධනය කිරිමේ වැඩසටහන
යටිතල පහසුකම් නගා සිටුවීමේ වැඩසටහන
පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ(ප්‍රාග්ධන) වැඩසටහන
ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ (පුනරාවර්තන) වැඩසටහන
2017 ප්‍රතිපාදන
2017වියදම
2018 ප්‍රතිපාදන
2018 වියදම
2019 ප්‍රතිපාදන
2019 වියදම


# මොන්රෝවියාවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානය - කාබනික පොහොර නිෂ්පාදනය සහ අලෙවිය


| | අංශය | වර්ෂය | |
|---|---|---|---|
| | | 2018 | 2019 |
| 1 | නිෂ්පාදිතකොම්පෝස්ට් ප්‍රමාණය(කි.ග්‍රෑ) | 152000 | 171000 |
| 2 | ලද ආදායම (රු.) | 296200.00 | 346110.00 |



## ඉදිකිරීම් ද්‍රව්‍ය තත්ව පරීක්ෂණාගාර ආදායම් උත්පාදනය

| | ඉදිකිරීම් ද්‍රව්‍ය තත්ව පරීක්ෂණාගාර | 2017 ආදායම | 2018 ආදායම | 2019 ආදායම |
|---|---|---|---|---|
| 1 | ගාල්ල තත්ව පරීක්ෂණාගාරය | 3,097,850.00 | 3,167,500.00 | 8,264,800.00 |
| 2 | මාතර තත්ව පරීක්ෂණාගාරය | 7,526,658.50 | 4,746,328.93 | 7,682,500.00 |



## පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සඳහා පසුගිය තෙවසර තුල පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන් (MTDI)

| අංශය | සහභාගී වූ සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| මූලික පරිගණක පුහුණුව | 1 | 1 | 2 |
| පරිගණක දෘඩාංග | 4 | 3 | |
| Computer Networking | | | 1 |
| MS ACCESS | 3 | 1 | 2 |
| ADVANCE EXCEL | | 5 | 1 |
| AUTOCAD 2D/3D | | 1 | |
| Graphic Design | 1 | | 1 |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 5 | 5 | 2 |
| වැටුප් පරිවර්තනය | 11 | 3 | 5 |
| භාණ්ඩ සමීක්ෂණය හා ගබඩා කිරීම | 5 | 5 | 1 |
| බැංකු සැසැඳුම පිළියෙල කිරීම | | | 1 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 3 | 4 | 4 |
| විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 2 | 4 | 3 |
| විශ්‍රාම වැටුප් | 4 | 2 | 3 |
| සිගාස් | 2 | 2 | |
| PAYROLL | 5 | | 1 |
| පෞද්ගලික ලිපි ගොනුකරණය | 5 | 6 | 4 |
| ලිපි ගොනු කළමනාකරණය | 3 | 1 | 2 |
| කාල කළමනාකරණය | 3 | | 2 |
| කාර්යාල කළමනාකරණය | 1 | 3 | 6 |
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටි නිවාඩු | | | 1 |
| කාර්යාල විදුලි උපකරණ නඩත්තුව | | | 2 |

| අංශය | සහභාගී වූ සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2017 | 2018 | 2019 |
| | | | |
| ආපදා කළමනාකරණය | | 3 | 1 |
| ගැටුම් කළමනාකරණය | 3 | 2 | 1 |
| ව්‍යාපෘති කළමනාකරණය | 1 | 2 | 5 |
| වාහන නඩත්තුව | 3 | 4 | 3 |
| ප්‍රථමාධාර | 1 | | |
| රජයේ ඉඩම් කළමනාකරණය | 1 | 1 | |
| වාණිජ අත්තිකාරම් ගිණුම පිළියෙල කිරීම | 3 | 2 | |
| MS Office 2013 | 2 | | |
| නායකත්ව හැකියාව හා කණ්ඩායම් හැඟීම වර්ධනය | 3 | 7 | 2 |
| ඵලදායීතා සංකල්ප | 5 | | |
| සන්නිවේදන කුසලතා | 2 | 3 | 1 |
| ගීත රසාස්වාදය තුලින් ආතති කළමනාකරණය | | 4 | |
| ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | 1 | | |
| Voice Traning | 1 | 1 | |
| අපි අලුත් වෙමු | 1 | 1 | |
| හරිත ඵලදායිතාව | | 2 | |
| ඵලදායිතා තත්ත්ව මෙවලම් | 1 | | |
| වාහන අනතුරු හා අලාභහානි | 1 | 4 | 2 |
| නව්‍යකරණය | | 1 | |

| අංශය | සහභාගී වූ සංඛ්‍යාව | | |
| --- | --- | --- | --- |
| | 2017 | 2018 | 2019 |
| ඵලදායිතා සහතිකපත්‍ර පාඨමාලාව | 1 | 2 | 3 |
| අපි ලස්සනට ඉදිමු | 1 | 2 | |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත | 7 | | 2 |
| මුල් ළමා විය සංවර්ධනය | 4 | | |
| විගණන පනත | | 2 | 5 |
| පරිසර කළමනාකරණය | 97 | 96 | 70 |
| රැස්වීම් කළමනාකරණය | | 1 | 1 |
| රාජකාරි කටයුතු සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත | | 1 | 1 |
| **සහභාගී වූ ප්‍රමාණය** | 97 | 96 | 70 |

## 5.4 Financial Forecast

### මූල්‍යමය පුරෝකතනය

- පලාත් පාලන ආයතනවල ස්වයං උත්පාදන ආදාමය මගින් 100% ප්‍රාග්ධන වියදම් සපුරාගතහැකි වීම සහ පුනරාවර්ථන වියදමෙන් 25% සපුරාගත හැකිවීම. හිග ආදායම් ප්‍රතිශතය 10% කට වඩා අඩුවෙන් පවත්වාගෙන යා හැකි වීම සහ වාර්ෂිකව ස්වයං උත්පාදන ආදායම 25% කින් ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සැපයීම

වැඩසටහන් ව්‍යාපෘති අනුව වියදම් සාරාංශය

| වැඩසටහන් / ව්‍යාපෘති නාමය | 2017 සත්‍ය වියදම් (රුපියල්) | 2018 (ඇස්තමේන්තුව) (රුපියල්) | 2019 (ඇස්තමේන්තුව) (රුපියල්) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 2,202,041,406 | 2,380,103,000 | 2,480,786,588 |
| පළාත් සභා පරිපාලනය | 2,202,041,406 | 2,263,223,000 | 2,334,546,588 |
| සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා | 2,202,041,406 | 2,263,223,000 | 2,334,546,588 |
| ප්‍රාදේශීය සංවර්ධනය | 0 | 116,880,000 | 146,240,000 |
| පළාත් පාලන සේවා සහ ප්‍රජා සංවර්ධන කටයුතු | 0 | 116,880,000 | 146,240,000 |
| මූලධන වියදම් | 2,548,233 | 2,500,000 | 2,483,333 |
| පළාත් සභා පරිපාලන | 2,548,233 | 2,500,000 | 2,483,333 |
| සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා | 2,548,233 | 2,500,000 | 2,483,333 |
| මුළු වියදම් එකතුව | 2,204,589,638 | 2,382,603,000 | 2,483,269,921 |

# CHAPTER 6

## SWOT ANALYSIS

## ශක්තීන් , අවස්ථා , දුර්වලතා සහ තර්ජන විශ්ලේෂණය

## 6.1 Strengths

**ශක්තීන්**

01. වෘත්තීය නිපුණත්වයෙන් යුත් විවිධ හැකියාවන්ගෙන් යුත් කාර්ය මණ්ඩලයක් හිමි වීම.

02. පරීක්ෂණාගාර, යන්ත්‍රෝපකරණ, පහසුකම් පැවතීම.

03. දිස්ත්‍රික්ක 03 සඳහා සහකාර කොමසාරිස් කාර්යාල පැවතීම.

04. සහයෝගයෙක් ක්‍රියා කළ හැකි ස්වයං උත්පාදන හැකියාවන්ගෙන් යුතු පළාත් පාලන ආයතන ප්‍රධානීන් සිටීම.

05.13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලද බලය

06. මූලික පළාත් පාලන නීති වලින් හිමිවී ඇති බලතල

## 6.2 Weaknesses

**දුර්වලතා**

01. නීතිමය බලගැන්වීමක් නැති කසළ කළමණාකරණ මධ්‍යස්ථානයක් පවත්වාගැනිම.

02. ප්‍රමාණවත් කාර්යාල පහසුකම්, නිල නිවාස, වාහන පහසුකම් වැනි භෞතික සම්පත් වල හිගකම.

03.දෙපාර්තමේන්තුවේ ධාරිතාවයට ගැලපෙන කාර්යමණ්ඩල ය නොමැති කම.

04. මානව සම්පතින් නිසි ප්‍රයෝජන නොගැනීම

05. යල්පැන ගිය පළාත් පාලන නීති

06. පළාත් පාලන ආයතන තමා සතු බලතල ක්‍රියාත්මක නොකරන විට ඒ සඳහා පියවර ගැනීමට ඇති නීතිරීති වල ව්‍යාකූල බව.

07. කාර්යඵල ඇගයීමේ නිශ්චිත ක්‍රම නොමැති වීම.

08. පළාත් පාලන විෂය හා නීති රීති සම්බන්ධව හා අණපනත් සම්බන්ධව නිලධාරීන් තුල ඇති අවබෝධය අඩුකම.

09. චක්‍රලේඛ, අණපනත්, උපදෙස් හා පූර්වාදර්ශ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් දුර්වල වීම.

10.දේශීය පුහුණු අවම වීම හා විදේශීය පුහුණු නොමැති වීම.

11. අදාළ විෂය පථය පිළිබඳ නිසි අවබෝධයකින් තොරව කටයුතු කිරීම.

12. සේවක සුභසාධනය සම්බන්ධ ගැටළු.

13. විධිමත් තොරතුරු කළමණාකරණ පද්දතියක් හා තොරතුරු ආරක්ෂණ පද්ධතියක් නොමැතිවීම

14.තුන් දා නීතිය ක්‍රියාත්මක නොවීම.

15. කෙරෙන කාර්යයයන් පිළිබඳව මහජනතාව දැනුවත් නොවීම.

## 6.3 Opportunities

අවස්ථා

01. රාජ්‍ය අංශය පිළිබඳ මහජන විශ්වාසය

02. රාජ්‍ය වශයෙන් ලැබෙන්නාවූ අනුග්‍රහය

03. රාජ්‍ය නොවන හා පුද්ගලික අංශය පළාත් පාලන ආයතන සඳහා සහාය වීමට ඇති උනන්දුව

04. ක්‍රියාකාරී දේශපාලන අධිකාරීය

05. වෙනත් පළාත් සමග සම්බන්ධ වී දැනුම බෙදා ගැනීමට හා හුවමාරු කර ගැනීමට හැකිවීම හා ඒවා ක්‍රියාවට නැගීමට හැකිවීම

06. අවශ්‍ය පුහුණුවීම් ලබාගැනීම සඳහා වක්වැල්ල පුහුණු මධ්‍යස්ථානයේ සහය ලබාගත හැකිවීම

07. විවිධ ආයතනවලින් ප්‍රතිපාදන ලැබීම

08. මහජනතාවට වඩාත් සමීපතම ආයතන පැවතීම

09. පළාත පුරා විසිරුනු ආයතන මගින් විවිධ වූ සේවාවන් සැපයීම.

10. සෑම කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි දේශපාලන නියෝජනයක් පැවතීම.

11. ප්‍රයෝජනයට නොගත් සම්පත් පැවතීම සහ ඉවතලන කුණු සම්පතක් බවට පත්කර ගත හැකි වීම.

12. ප්‍රධාන නගරවලට ආසන්නව පිහිටීම.

13. විෂයානුබද්ධ සම්පත් දායකයින් සිටීම.

## 6.4 Threats

### තර්ජන

01. අනවශ්‍ය ලෙස දේශපාලන මැදිහත්වීම් පැවතීම.

02. පවත්නා නීති රීතිවල පවතින දුර්වලතා පැවතීම.

03. පෙත්සම්/පැමිණිලි ලැබීම් වල වර්ධනය.

04. අවිධිමත් සංවර්ධන කටයුතු සිදු වීම.

05. පළාත් පාලනය විෂයන් ක්‍රියාත්මක කිරීමේ ඇති ව්‍යාකූල බව.

06. වෙනත් අනපනත් හා ගැටීම.

07. භූගෝලීය පිහිටීම අනුව ස්වභාවික උපද්‍රව බහුල විම.

08. දේශපාලනික වෙනස්වීම් මත බලපෑම් මත තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීමේ ඒකීයභාවයක් පවත්වාගෙන යාම අපහසු වීම.

09. සැලසුම් අනුමත කිරීම, සශෝධනය සඳහා විශාල කාලයක් ගතවීම.

# CHAPTER 7

# ARRANGEMENTS FOR IMPLEMENTATION

# ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම

පළාත් පාලන දෙපාර්තමේන්තුව තුල ශක්තිමත් කළමනාකරණ පද්ධතියක් නිර්මාණය වී ඇත . කාර්ය මණ්ඩලය තුල හොඳින් ගොඩනැගුණු ඒකාබද්ධතාවය මෙන්ම ධනාත්මක සංවිධාන සංස්කෘතිය මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වේ. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අරමුණු , ඉලක්ක, උපක්‍රම හා ප්‍රතිපත්ති කරා ළගා වීම සඳහා ක්‍රියාකාරි සැලසුම්, අයවැය සැලසුම්, කාර්යසාධන සැලසුම් මනා රුකුලක් වේ. මෙම අදියර තුල සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට වැදගත් භූමිකාවක් හිමි වේ. එය ඇමුණුම් අංක 04 මගින් ඉදිරිපත් කර ඇත. සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මෙහි අන්තර්ගතයන් පහත පරිදි වේ.

- පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය

  සංවර්ධනයෙහි වැදගත්ම අංගය වශයෙන් සංවර්ධිත මාර්ග පද්ධති නිර්මාණය සඳහා ඉතා වැදගත් අවධානයක් යොමු කර ඇත. කිලෝමීටර සියයේ නව පාරවල් ඉදිකිරීම හා නඩත්තුවත්, මීටර පන්දහසේ පැති කාණු ඉදිකිරීමත්, මීටර පන්දහසේ පැතිබැම් ඉදිකිරීම මෙහි ඉලක්ක වී ඇත. සනීපාරක්ෂක ජල සැපයුම යටතේ පවුල් 1250කට සනීපාරක්ෂක ජල සැපයුම සිදු කිරීමට යෝජිතය. මනා කළමනාකාරණයකින් යුත් ආදාහනාගාර පද්ධති හා සුසාන භූමි යටතේ ආදාහනාගාර සහ සුසාන භූමි සංවර්ධනය ඉලක්ක වී ඇත. එමෙන්ම මනාව සංවර්ධනය කළ පුස්තකාල , පෙර පාසල්, ආර්යුවේද මධ්‍යස්ථාන, මහජන ක්‍රිඩාංගන යටතේ විවිධ පහසුකම් සැපයීම ඉලක්කයන් වී ඇත. යටිතල පහසුකම් සංවර්ධනය යටතේ සැලැස්මෙහි ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.මි.4335.6 වෙන් කර ඇත.

- සනීපාරක්ෂක පහසුකම් සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

  බැහැර කිරීමේ ද්‍රව්‍ය අවම කිරීමේ ඉලක්කය මත විවෘතව බැහැරවන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණ ප්‍රමාණය වැඩි කිරිම, කොම්පෝස්ට් නිෂ්පාදනය වැඩි කිරීම, ස්වයං අභිපේරණ කාර්ය මණ්ඩලය ඇති කිරිම අපේක්ෂිත ප්‍රතිඵල වේ.මෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 722කි. ඩෙංගු සහ වෙනත් බෝවන රෝග වැලැක්වීම ඉලක්ක කර ගනිමින් ඩෙංගු සහ වෙනත් බෝවන රෝග පැතිරීම අවම කිරීම, බෝනොවන රෝග පාලනය, විවෘතව කසළ දමන ස්ථාන අවම කිරිම, අවසන් බැහැර කිරීම් අවම කිරීම යන ප්‍රතිඵලයන් බලාපොරොත්තුවෙන් විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීමට නියමිතය.මෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.2550කි. තිරසාර පාරිසරික නඩත්තුව ඉලක්ක කරගනිමින් විවෘතව බැහැරලිම් අවම කිරිම, විවෘතව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම, විවෘතව බැහැර වන මළ අපද්‍රව්‍ය අවම කිරීම, කාර්යමණ්ඩල අභිප්‍රේරණය කිරීම යන ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.මි.850 වෙන් කර ඇත.

- පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම

පළාත් පාලන ආයතන වල ආදායම වැඩි කිරීම, පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින් පළාත තුල නවීකරණය වූ වෙළදසැල් 200 ස්ථාපිත කිරීම , පළාත තුල නවීකරණය කළ සතිපොළ 200 ස්ථාපිත කිරීම, උද්‍යාන 100 ස්ථාපිත කිරීම, ක්‍රීඩා පිට්ටනි 100 නවීකරණය කිරීම, ප්‍රදේශය තුල වාහන නැවතුම් අංගන 500 ස්ථාපිත කිරීම, ප්‍රදේශය තුල සංචාරක ආකර්ශන ස්ථාන 500 සංවර්ධනය කිරීම, ප්‍රදේශය තුල දිවා සුරකුම් මධ්‍යස්ථාන සහ වැඩිහිටි නිවාස 15 සංවර්ධනය, පළාත් පාලන ආයතන ගොඩනැගිලි නවීකරණය කර අළුතින් ඉදි කිරීම, ශාරීරික සුවතා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා සැලැස්මෙහි ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.මි. 7,385 වෙන් කර ඇත.

- ධාරිතා සංවර්ධනය සහ මානව සම්පත් සංවර්ධනය

සියළුම සේවක මණ්ඩල සහ පළාත් පාලන ආයතන සේවකයන්ගේ ධාරිතාවය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් මනා ලෙස මානව සම්පත සංවර්ධනය කිරීමත්, කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ගොඩනැංවීම සඳහා ස්වයං අභිප්‍රේරණ කාර්යමණ්ඩලයක් නිර්මාණය සහ 100% ඊ-සේවාව මුදුන් පමුණුවා ගැනීමත්, ආයතනික ධාරිතාවය ගොඩනැංවීම ඉලක්ක කරමින් මනා ලෙස ආයතන සංවර්ධනයත් යන ප්‍රතිඵල ලගාකර ගැන්ම සඳහා සැලැස්මෙහි ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.මි.7385 වෙන් කර ඇත.

- නීතිය හා ක්‍රියාත්මක කිරීම

ප්‍රාදේශීය සභා තුල මනා මූල්‍ය විනයක් ඇති කිරීම, සියළුම පළාත් පාලන ආයතනවලට අත්‍යවශ්‍ය අණපනත් ලබා ගැනීමේ වට පිටාවක් නිර්මාණය කිරීම, පළාත් පාලන ආයතන කටයුතු විධිමත් කිරීම හා නිලධාරීන් දැනුවත් කිරීම ඉලක්ක කර ගනිමින් ආයතනය තුල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාව වර්ධනයත්, පළාත් පාලන ආයතන සතු කඩකාමර බදු දීමේ කටයුතු තවදුරටත් විධිමත් කිරීම මගින් පළාත් පාලන ආයතන වල ආදායම වැඩි කිරීමත්, ඉඩම් කට්ටි කිරීම පිළිබඳ කටයුතු විධිමත් කිරීම ඉලක්ක කර ගනිමින් පළාත් පාලන ආයතන බල ප්‍රදේශ වල ඉඩම් කට්ටි කිරිමේදී ඇතිවන පාරිසරික හානි වැලැක්වීම සහ ජනතාවට වඩාත් පහසුකම් සහිත නේවාසික භාවිතය සඳහා ඉඩම් කොටසක් ලැබීම තහවුරු කිරීමත් යන ප්‍රතිඵල බලාපොරොත්තු වේ. මෙම කටයුතු සඳහා සැලැස්මෙහි ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.මි.16 වෙන් කර ඇත.

සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග වශයෙන් විවිධ ප්‍රභවයන් යටතේ ප්‍රතිපාදන සපයනු ලබන ආයතන සමඟ මනා සම්බන්ධීකරණය මගින් මූල්‍ය ප්‍රතිපාදනයන් ලබා ගැනීම සිදුවේ. මෙහිදී පහත සඳහන් ප්‍රභවයන් යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණය මගින් පළාත් පාලන ආයතන සඳහා ප්‍රතිපාදන වෙන් වේ.

- නිශ්චිත සංවර්ධන ප්‍රදාන
- උපමාන පාදක සංවර්ධන ප්‍රදාන
- තුලිත සංවර්ධන අරමුදල
- පසුබට කලාප සංවර්ධන අරමුදල
- විශේෂ ව්‍යාපෘති අරමුදල්
- මන්ත්‍රී ප්‍රතිපාදන
- පළාත් පාලන අමාත්‍යාංශය සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හරහා ලැබෙන ප්‍රතිපාදන
- වෙනත් අරමුදල්

සෑම වර්ෂයකම දෙවන කාර්තුව වන විට ඉදිරි වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු පිළියල කිරීම සිදු කරනු ලබන අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සකස් කළ අයවැය ඇස්තමේන්තු ප්‍රධාන අමාත්‍යාංශය හරහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) වෙත යොමු කරනු ලැබේ. එම ඇස්තමේන්තු මුදල් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අතර, වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් දකුණු පළාත සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදන වලින් පළාත් පාලන දෙපාර්තමේන්තුවට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) විසින් දන්වනු ලැබේ.

ඉදිරි වර්ශයේදී ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ව්‍යාපෘති සෑම වර්ෂයකම සැප්තැම්බර් මස වන විට පළාත් පාලන ආයතන හරහා පළාත් පාලන සහකාර කොමසාරිස් නිර්දේශ සහිතව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගනු ලැබේ.

මෙයට අමතර වශයෙන් පහත සඳහන් ප්‍රභවයන් හරහා ද ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වේ.

- මහජන අදහස් හා ඉල්ලීම්
- ප්‍රධාන ලේකම් හරහා යොමු කිරීම්
- ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් යොමු කිරීම්
- ප්‍රධාන අමාත්‍යාංශය
- ජනාධිපති කාර්යාලය
- අග්‍රාමාත්‍ය කාර්යාලය
- මහජන නියෝජිතයින්ගේ නිර්දේශ සහ ඉල්ලීම්

ඉහත පරිදි විවිධ මූලශ්‍ර මගින් ලැබෙන සංවර්ධන ව්‍යාපෘති හා කාලීන වශයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු ව්‍යාපෘති ප්‍රමුඛතවය හා වෙන් වී ඇති ප්‍රතිපාදන සමඟ ගැලපීමෙන් පසු වාර්ෂික සංවර්ධන සැලැස්ම පිළියෙල කරනු ලැබේ.


සකස් කරනු ලැබූ සැලැස්ම ප්‍රධාන අමාත්‍යාංශ හරහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) වෙත යොමු කරනු ලැබේ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) අනුමැතියෙන් පසු අදාල සැලැස්මේ ව්‍යාපෘති පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත පිටපත් සහිතව අදාල පළාත් පාලන ආයතන වෙත ක්‍රියාත්මක කිරීම සඳහා යොමු කරනු ලැබේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අතරතුර විවිධ හේතූන් නිසා අවලංගු කිරීම් හා සංශෝධන ලැබෙන ආකාරය අනුව ඉහත සඳහන් අයුරින් අදාල අංශ වෙත යොමු කිරීමට පියවර ගනු ලැබේ.


- **සෑම වසරකම දෙසැම්බර් 31 අවසන් වන විට පෙර වසරට අදාල අවිච්ඡේද සහ අතැති බිල් හඳුනාගෙන වෙන් කළ ප්‍රතිපාදන මගින් අතැති බිල් සහ අවිච්ඡේද අඩු කර ඉතිරි වන ප්‍රතිපාදන ප්‍රමාණය සඳහා ඉදිරි සංවර්ධන සැලැස්ම සකස් කරනු ලැබේ.**
- **සෑම වසරකම මුල් සතිය වන විට අදාල එක් එක් අංශ යටතේ සකස් කරන ලද සැලැස්ම ප්‍රධාන අමාත්‍යාංශය හරහා සැලසුම් ලේකම් කාර්යාලය වෙත යොමු කරයි.**

- මුදල් කොමිසන් සභාවේ එකගතාවය මත සැලසුම් ලේකම් කාර්යාලයේ අනුමැතිය සහිතව මසක් තුල සංවර්ධන සැලැස්ම පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කරයි. රට තුල පවතින ආර්ථිකමය , දේශපාලනමය වාතාවරණයන් , අයවැය සම්මත වීම්, අසුරා තැබීම්, වැනි තත්වයන් මත මෙහි කාල රාමුව වෙනස් විය හැක.
- ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති එම කාර්යාලයෙන් ප්‍රතිපාදන සහිතව අදාල පළාත් පාලන ආයතන වෙත යොමු කරන ලෙස ලිඛිතව දන්වා එවනු ලැබේ. (තුලිත , පසුබට කලාප හා විශේෂ ව්‍යාපෘති) එම ව්‍යාපෘති අදාල පළාත් පාලන ආයන වෙත යොමු කරනු ලැබේ.
- එසේම අනෙකුත් ආයතනවල ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපාති පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලැබෙන පරිදි එම ආයතන විසින් නිකුත් කරන ලද උපදෙස් හා මාර්ගෝපදේශයන්ට අනුකූල වන සේ ක්‍රියාත්මක කරනු ලැබේ.
- පළාත් සභා මන්ත්‍රීවරුන්ට වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති යෝජනා දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලයෙන් අනුමත කර යොමු කරන ආකාරයට පළාත් පාලන ආයතන වෙත යොමු කර ක්‍රියාත්මක කරනු ලැබේ.

# ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම



# සංවර්ධන අවශ්‍යතා හඳුනා ගනිමින් වාර්ෂික සැලැස්ම පිළියෙල කිරීම



## 2016 , 2017 , 2018 හා 2019 වර්ෂ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | අංශය | 2016 වර්ෂය | | 2017 වර්ෂය | | 2018 වර්ෂය | | 2019 වර්ෂය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **ප්‍රතිපාදන (රු.මි. ) PSDG** | **ප්‍රතිපාදන (රු.මි.) CBG** | **ප්‍රතිපාදන (රු.මි. ) PSDG** | **ප්‍රතිපාදන (රු.මි.) CBG** | **ප්‍රතිපාදන (රු.මි. ) PSDG** | **ප්‍රතිපාදන (රු.මි.) CBG** | **ප්‍රතිපාදන (රු.මි.) PSDG** | **ප්‍රතිපාදන (රු.මි.) CBG** |
| 1 | පළාත් පාලන මාර්ග | 60.00 | 110.00 | 50.00 | 40.83 | 55.00 | 41.00 | 75.00 | 41.00 |
| 2 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | 35.00 | | 29.00 | | 29.00 | | 31.00 | |
| 3 | ප්‍රජා ජල සම්පාදන | 40.00 | | 33.00 | | 27.00 | | 35.00 | |
| 4 | පළාත් පාලන වෙනත් සේවා | 15.00 | 17.50 | 13.00 | 13.54 | 14.00 | 14.00 | 55.00 | 14.00 |
| 5 | සති පොළ සංවර්ධනය | | 7.50 | | 13.42 | | 15.00 | | 15.00 |
| 6 | ආදාහනාගාර සංවර්ධනය | | 15.00 | | 18.75 | | 20.00 | | 20.00 |
| 7 | පූර්ව ළමාවිය | | | | | | | 4.00 | |
| 8 | පසුගාමී පළාත් පාලන ආයතන නගා සිටුවීම | | | | | | | | 50.00 |
| 9 | මහා නගර සභා ධාරිතා සංවර්ධනය | 1.00 | | | | | | | |
| | **එකතුව** | **151.00** | **150.00** | **125.00** | **86.54** | **125.00** | **90.00** | **200.00** | **140.00** |
| | | **301.00** | | **211.54** | | **215.00** | | **340.00** | |

# CHAPTER 8

# STRATEGIC REVIEW, EVALUATION AND CONTROL

# උපායමාර්ගික සමාලෝචනය, ඇගයීම සහ පාලනය

අනුමත සැලැස්මේ ව්‍යාපෘති සඳහා පලාත් පාලන ආයතන විසින් සකස් කරන ලද ඇස්තමේන්තු පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාල හරහා පලාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වනු ලබයි. එම ඇස්තමේන්තු අනුමත කිරීමේ බලය ලැබෙන ආකාරයට තාක්ෂණ නිලධාරි , දිස්ත්‍රික් ඉංජිනේරු පරීක්ෂාවෙන් පසු පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබේ.

- එම ඇස්තමේන්තු අනුමැතියෙන් පසු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර වැඩ අවසන් වූ පසු වැඩ අවසන් වාර්තාව සමග සහකාර කොමසාරිස් සහ දිස්ත්‍රික් ඉංජිනේරුගේ නිර්දේශ මත බිල්පත පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරයි. මාර්ග ඉදිකිරිම වැනි ව්‍යාපෘතියක් වන්නේ නම් ගාල්ල දිස්ත්‍රික්කය සඳහා ගාල්ල තත්ව පරීක්ෂාගාරයෙන්ද, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක සඳහා මාතර තත්ව පරීක්ෂාගාරයෙන්ද තත්ව පරීක්ෂාවක් සිදු කර ඉංජිනේරු නිර්දේශ කිරීමක් සිදු කරයි.
- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය සහ පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් මෙම ව්‍යාපෘති අධීක්ෂණය කිරිමක් සිදු කරනු ලබයි.
- පසුව මෙම ව්‍යාපෘති නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) නිර්දේශයන් සහිතව පළාත් පාලන කොමසාරිස් මගින් අනුමත කර ප්‍රධාන ගණකාධිකාරී හරහා ගෙවීම් කර චෙක්පත අදාල පළාත් පාලන ආයතනය වෙත යොමු කරයි. මෙහිදී පළාත් පාලන ආයතන මගින් බිල්පත් ලද පිළිවෙල අනුව චෙක්පත් නිකුත් කරනු ලබයි.
- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලවලට අනුබද්ධව සේවයකරනු ලබන විමර්ශන නිලධාරීන් හරහා ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධව මහජනතාව හෝ වෙත් පාර්ශව වෙතින් ලැබෙන පැමිණිලි විමර්ශනයට ලක්වන අතර, සිදුවන දූෂණ හා අක්‍රමිතා අවම කිරීමට කටයුතු කරනු ලැබේ.
- එසේම පළාත් සභාවේ අභ්‍යන්තර විගණන හා රජයේ විගණන අංශ මගින් ද පලාත් පාලන ආයතන මගින් සිදු කරනු ලබන ව්‍යාපෘති නිරන්තර විගණනයට ලක් කෙරේ.